අප ජීවත් වන්නේ මිනිස් ඉතිහාසයේ තීරණාත්මක අවධියක බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඉන්ධන අර්බුදය, ආහාර අර්බුදය, පරිසර දූෂණය සහ ගෝලීය ත්‍රස්තවාදය වැනි ගැටළු රැසකට විසඳුම් සෙවීමට මිනිසාට සිදුව ඇති බව නොරහසකි. අඳුරු යුගයක පෙර නිමිති පහළවෙමින් පවතින මෙවන් අවධියක බලාපොරොත්තුවේ අරුණළු කිරණ උදුකරවන එක් සිදුවීමක් අනාගතයට ඉතුරුව තිබේ.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීම එම සිදුවීමයි. සැබැවින්ම අප සිටින්නේ යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමේ කාල වකවානුවේ යැයි සිතීමට තරම් නිවැරදි වූ සහ බයිබලයානුකූල වූ හේතු කවරේද?

මෙම කුඩා පොතෙහි සාකච්ඡාවට භාජනය වනුයේ එම අතිශයින්ම තීරණාත්මක හේතු සාධක පිළිබඳවයි. අප සිතනවාට වඩා යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම ආසන්න බව මේ පොතෙහි අඩංගු කරුණු ඔබට ඒත්තු ගන්වනු ඇත.

යුගාන්තයක පෙර නිමිති

නෙවිල් ජයසුන්දර

# යුගාන්තයක

## පෙර නිමිති



නෙවිල් ජයසුන්දර

# යුගාන්තයක පෙර නිමිති

නෙවිල් ජයසුන්දර

# යුගාන්තයක පෙර නිමිති

මෙම පොතේ අඩංගු කුඩා කොටස් උපුටා ගැනීම හැරුණු විට,
මෙම පොත මුද්‍රණය කර විකිණීම, බෙදාහැරීම හෝ
කවර ආකාරයකින් හෝ ප්‍රචාරය කිරීමට අවසරයක් නොමැත.

**1 වන මුද්‍රණය : 2008 අගෝස්තු**
**2 වන මුද්‍රණය : 2011 අප්‍රේල්**

**ISBN** 978-955-51101-0-5

**විස්ඩම් පබ්ලිෂර්ස් විසින් මුද්‍රණය කරන ලදී.**
**විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 6.**
**දුරකථනය: 011-2581901**

පිටකවරය : පිලිප් එබ්‍රැහැම්

---

**මුද්‍රණය:**
කේ. සී. ප්‍රින්ටර්ස්
47, එම්. ඊ. පෙරේරා මාවත,
කොරළවැල්ල,
මොරටුව.

# පටුන


| | | |
|---|---|---|
| | | පිටුව |
| | හැඳින්වීම | 1 |
| 1. | දළු ලූ අත්තික්කා ගස | 4 |
| 2. | රෝම අධිරාජ්‍යය යළි පිබිදීම | 16 |
| 3. | ලොව සතර දෙසට බෙදුනු යුද්ධබලය | 23 |
| 4. | පිට සක්වල ජීවීන් පිළිබඳ විශ්වාසය | 31 |
| 5. | අවසාන කාලය පිළිබඳ සාක්ෂි ගොන්න | 36 |
| 6. | ඉවත්කර ගැනීමේ මෙහෙයුම | 42 |

# හැඳින්වීම

ස්වාමී වූ යේසුස්වහන්සේ නැවතත් මෙලොවට පැමිණෙන බව ඔබ අසා තිබෙනවාද? මීට වසර 2000 ට පමණ පෙර ස්වාමී වූ යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමෙන් අනතුරුව ගෝලයන් බලාසිටියදී ස්වර්ගයට ඔසවා ගනු ලැබූ අයුරු ශුද්ධ බයිබලයේ ක්‍රියා පොතේ 1 වන පරිච්ඡේදයහි සඳහන්ව තිබේ. උන්වහන්සේ නොපෙනී ගිය පසු තවදුරටත් ස්වර්ගය දෙස බල බලා සිටි ගෝලයන් ඉදිරිපිට දේවදූතයන් දෙදෙනෙක් මනුෂ්‍ය ආකාරයෙන් දර්ශණය වූහ. එහිදී ඔවුන් විසින් ගෝලයන්ට පැවසූ පණිවිඩය ක්‍රියා 1:11 හි සඳහන්ව තිබේ. **"ගලීලයෙහි මනුෂ්‍යයෙනි, නුඹලා ස්වර්ගය දෙස බල බලා ඉන්නේ මක්නිසාද? නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු අකාරයෙන්ම (අපසු) එනවා ඇතැයි කීවෝය".** එදා මෙදා තුර ජීවත් වූ සියලු කිතුණු ඇදහිලිවතුන් යේසුස්වහන්සේගේ එම දෙවන පැමිණීම බලාපොරොත්තුවෙන් සිට ඇත. එම බලාපොරොත්තුව ඔබටත් ,මටත් නියතින්ම තිබිය යුතු බලාපොරොත්තුවකි. තවද ස්වාමීවූ යේසුස්වහන්සේ විසින්ම ගෝලයන්ට ප්‍රකාශ කළ, යොහන් 14:3 හි සඳහන්ව ඇතිදෑ සලකා බලන්න, **"නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරමි නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළගට ගන්නෙමි".** එසේ උන්වහන්සේ පොරොන්දු වූ දෙය උන්වහන්සේ ඉටු කරන බව සහතිකය. යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම නැමති ඒ අපූර්ව සිදුවීම සිදුවන අයුරු පිළිබඳව පාවුල් ප්‍රේරිත තුමා 1 තෙසලෝනික 4:16 සහ 17 පදවල මෙසේ විස්තර කරයි. **"මක්නිසාද ස්වාමින්වහන්සේ මහත් ශබ්දයක්ද, උත්තම දේවදූතයකුගේ හඬද, දෙවියන්වහන්ස්ගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළා වූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි ඔවුන් සමග ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුළුවලින් අහසට ඇදගනු ලබන්නෙමුව".**

යේසුස්වහන්ස්ගේ ඉහත සඳහන් දෙවැනි පැමිණීමේ බලාපොරොත්තුව මුල් යුගයේ පටන් ඇදහිලිවන්තයන්ගේ සිත් තුළ රැඳී පැවතුණි.

ඒනිසාම එකිනෙකාට අචාර සමාචාර කිරිමේදි පවා යේසුස්වහන්සේගේ පැමිණීම පිළිබඳ සිහිකරවමින් ඔවුහු **"මරනාතා"** යන යෙදුම භාවිතා කළහ. එහි අර්ථය නම්, "ස්වාමීන්වහන්සේ එන සේක" යනුයි. එය එම අදහසින් 1 කොරින්ති 16:22 හි පාවුල් තුමා විසින් සඳහන් කර ඇත. වර්තමාන ඇදහිලවන්තයෝ ආචාර සමාචාරයේදී මරනාතා යන වචනය භාවිතා කරනු සුලභව අසන්නට නොලැබුණත් ස්වාමී වූ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම කතාබහට ලක්කරමින් සිටින අතර උන්වහන්සේගේ පැමිණීම අත ළඟ යැයි විශ්වාස කරති. විශේෂයෙන්ම වර්ථමාන ලෝකයේ තාක්ෂණික දියුණුව, දේශපාලන වාතාවරණය හා ස්වාභාවික විපත්ති, නිසා ඇදහිලිවත්හු යේසුස්වහන්සේගේ පැමිණීම අත ළඟයැයි විශ්වාස කිරිමටත්, ප්‍රකාශ කිරීමටත් පෙලෙඹෙති.

සැබැවින් අප සිටින්නේ යේසුස්වහන්සේගේ පැමිණීමේ කාල වකවානුවේ යැයි ඔබ සිතන්නේද? එසේ සිතන්නට නිවැරදි වූ සාධාරණ වූ බයිබලයානුකූල වූ හේතු කවරේද? **"බලව යුගාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටින්නෙමි"** යි යේසුස්වහන්සේ මතෙව් 28:20 සඳහන් කළ එම යුගාන්තිම කාලය පැමිණෙමින් තිබෙන බවට සාක්ෂි ප්‍රමාණවත්ව තිබේ.(ලෝකාන්තිමය දක්වා යන වචනයෙහි නිවැරදි අර්ථය යුගාන්තිමය බව බයිබල් පරිවර්තකයන් දැන් පිලිගනිති). අප ජීවත්වන වර්තමාන සභා යුගය ආරම්භ වූයේ පළමු ශත වර්ෂයේ පෙන්තකොස්ත දවසේදීය. මෙම යුගයට අවසානයක්ද තිබිය යුතුය. මෙම යුගය කෙළවර, එනම් සභා යුගය හෙවත් දේව අනුග්‍රහයේ යු ගය කෙළවර වනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමෙනි. එසේ නම්, මෙම යුගයේ කෙළවරට දැන් අප ලඟා වී සිටින බවට සාක්ෂි කවරේද? ඒ පිළිබඳ ඉතා පැහැදිළි සාක්ෂි කිහිපයක් අප ඉදිරිපිට තිබෙන බව මගේ විශ්වාසයයි. පහත කෙටියෙන් සදහන් කෙරෙන එම සාක්ෂි සලකා බලන්නට ඔබට ඇරයුම් කරමි. එවිට අප හිතනවාටත් වඩා යේසුස්වහන්සේගේ පැමිණීම අත ළඟ බව ඔබට ඒත්තු යනු ඇත. අප ජීවත් වනුයේ මෙම යුගයේ අන්තිම කෙළවරේ බවට සාක්ෂි පහක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. ඉදිරි පරිච්ජේද පහේ සාකච්ඡාවට භාජනය වනුයේ එම සාක්ෂි පහයි.

1. ඉශ්‍රායෙල් ජාතියේ යලි උපත

2. පුරාණ රෝම අධිරාජ්‍යය යුරෝපාකරය නමින් යළි පිබිදීම.

3. ලෝකයේ හමුදා බලය භූගෝලමය හා දේශපාලන මතවාදයට අනුව,
හතර දිසාවකට බෙදී පැවතීම.

4. පිටසක්වල ජීවීන් සිටින බවට ඇති විශ්වාසය ලෙව පුරා ප්‍රචලිත වීම.

5. භූමිකම්පා, සාගත, වසන්ගත, සුනාමි, ගෝලීයකරණය, පරිසර දූෂණය, ගෝලීය උෂ්ණත්වය වැඩිවීම, මුහුදේ ජල මට්ටම ඉහල යෑම, ඕසෝන් ස්ථරය පලුදුවීම, අන්තර්ජාලය, ක්‍රෙඩිට් කාඩ් භාවිතය, යුද්ධ හා යුද්ධ ප්‍රවෘත්ති, ඇතුලු තවත් සාක්ෂි කිහිපයක එකතුව. මෙම සියලු සාක්ෂි එක මල්ලකට දමා, මෙම යුගයේ අවසානය පිළිබඳ සාක්ෂි ගොන්න යැයි

නම් කල හැක.

# 1
# දළු ලෑ අත්තික්කා ගස
## (ඉශ්‍රායෙල් ජාතියේ යලි උපත)

යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමට පෙර මෙලොව සිදුවන විවිධ සිදුවීම් පිළිබඳව පවසන අතරතුරේදී ස්වාමී වූ යේසුස්වහන්සේ මෙවැනි ප්‍රකාශයක් කළ සේක. "**අත්තික්කා ගහේ උපමාව ඉගෙන ගනිල්ලා. එහි අතු මෘදුව කොල හටගන්න කල ග්‍රීෂ්ම කාලය ළඟ බව නුඹලා දන්නහුය**" (මතෙව් 24:32). මෙම බයිබල් පදය අප ජීවත් වන වර්තමානයට විශේෂයෙන්ම අදාල වන දේව වචන කොටසකි. අත්තික්කා ගසේ අතු මෘදුව කොල හට ගැනීම අපගේ ඇස් පනාපිටම සිදුවී තිබේ. එද අත්තික්කා ගහේ උපමාවෙන් යේසුස්වහන්සේ කතා කළේ ඉශ්‍රායෙල් ජාතිය පිලිබඳව බව අපි පැහැදිලි කර ගතයුතු වෙමු. ශුද්ධ බයිබලයෙහි "**අත්තික්කා ගස**" ඉශ්‍රායෙල් ජාතිය නිරූපණය කරයි. කරුණාකර යෝවෙල් 1:7 සහ මතෙව් 21:18,19 පද කියවා බලන්න. අත්තික්කා ගස දළු දමන විට ග්‍රීෂ්ම කාලය ළඟ බව එනම් මතෙව් 24:33 හි සඳහන් ලෙස, උන්වහන්සේ දෙරටු සමීපයෙහි බව, යේසුස්වහන්සේ පැවසූ සේක. මේ නිසා යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමත්, එය සිදුවන කාලවකවානුවත් පිළිබද නිවැරදි දර්ශකයක් ලෙස " **අත්තික්කා ගහේ දළු ලෑම**" සැලකිය හැක. එනම් ඉශ්‍රායෙල් ජාතියේ යලි උපත එම දර්ශකයයි.

1948 වසරට පෙර මෑත ඉතිහාසය තුළ ඉශ්‍රායෙල් රට ලෝක සිතියමෙහි සඳහන් ව තිබුණේ නැත. පුරාණ ලෝකයෙහි ප්‍රධාන රටක් ලෙස ඉශ්‍රායලය පැවතුන නමුදු අවුරුදු 2500 පමණ කාලයක් වහල්කමේද, විසුරුවනු ලැබීමේද, පීඩාවට යටත්ව සිටි ඉශ්‍රායෙල් ජාතිය තමන්ගේම යැයි උරුමකම් කියන්නට ගමක් රටක් නොමැතිව ලෝකයේ විවිධ රටවල ජීවත් වූහ. ශුද්ධ බයිබලයෙහි නිවැරදිව සඳහන් වී ඇති පරිදි පළමුව ක්‍රිස්තු පූර්ව 722 දී අෂූර්වරුන් විසින්

ඉශ්‍රායෙල් ගෝත්‍ර දහයක්ද, ක්‍රිස්තු පූර්ව 600 දී පමණ බබිලෝනිවරුන් විසින් ඉතිරි ගෝත්‍ර දෙකද ඉශ්‍රායෙල් නමින් හැඳින් වූ භූමි භාගයෙන් ඉවත් කොට වහල්කමට ගෙනයන ලදී.

ඉන් වසර 70 ට පසු සෙරුබ්බාබෙල්ගේ නායකත්වයත් යටතේ ඔවුන් සමහරෙක් ආපසු ඉශ්‍රායෙල් රට වෙත හැරී ආහ. පුලුස්සා දමා තිබූ දේව මාළිගාව ඔවුහු යලි ගොඩ නැගූහ. ඉන් වසර 400 ට පමණ පසු ස්වාමී වූ යේසුස්වහන්සේ උපත ලැබූ සේක. උන්වහන්සේගේ මරණයත්, මළවුන්ගෙන් නැවත නැඟිටීමත්, ස්වර්ගයට ඔසවා ගනු ලැබීමත්, ශුද්ධාත්මයාණන්වහන්සේ මෙලොවට එවීමෙන් අලුත් ගිවිසුම් සභාව පිහිටුවීමත් යන සිදුවීම් වලින් අනතුරුව, ක්‍රිස්තු වර්ෂ 70 දී ටයිටස් නම් වූ රෝම හමුදු නිළධාරියාගේ මෙහෙයවීමෙන් යෙරුසලම් නගරය සහමුලින්ම විනාශ කරන ලදී. මෙය සිදුවන බවට ස්වාමී වූ යේසුස්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට පැවසූ අනාගතවාක්‍ය මතෙව් 24 වැනි පරිච්ඡේදයෙහි ලියා තිබේ. එතැන් පටන් සියලු ඉශ්‍රායෙල් ජාතිකයන් තම මව්බිමෙන් පන්නා දමනු ලැබ ලෝකයේ සතර දිග්භාගයට විසිර ගියහ. ඉශ්‍රායෙල් යන නමද ලෝක සිතියමෙන් මැකී ගියේය.

පුරා වසර 2000 ක් පමණ ඉශ්‍රායලය ජාතියක් වශයෙන් ෙ නාපැවතුණය. එහෙත් යම් දිනක අත්තික්කා ගහ දළුලෑමට නියමිතව තිබිණි. දෙවියන්වහන්සේගේ කාලසටහන අනුව එය සිදුවිය යුතු විය. මෑත ඉතිහාසයේ සිදු වූ අති විශ්මයජනක සිදුවීමක් සනිටුහන් කරමින් 1948 මැයි 15 වැනිදා ඉශ්‍රායලය නැවත රටක් සහ ජාතියක් ලෙස නිදහස ලබා ගත්තාය. විසිවන ශතවර්ෂයේ සිදු වූ අනාගත වාක්‍යය ඉටුවීමට අදාල ප්‍රබලතම සිදුවීම මෙයයි. එදා පටන් පසුගිය වසර හැටතුනක් මුළුල්ලේ අත්තික්කා ගහ දළුලා සරුසාරව වැඩෙන අයුරු අපි බලා සිටිමු. මේ සිදුවීම පසුපස තිබෙන දෙවියන්වහන්සේගේ හස්තය පිළිබඳව අපි දැන් සලකා බලමු.

## ඉටු වූ අනාවැකි

ඉශ්‍රායෙල්වරුන්ගේ යළි එක්රැස් කරනු ලැබීම ගැන මීට වසර 2500ටත් පෙර දෙවියන්වහන්සේ තම ප්‍රොපේතවරුන් කරණකොටගෙන පවසා තිබුණේ මෙසේය...

යෙසායා 11:11 සහ 12,

**"ඒ දවසෙහි ස්වාමින්වහන්සේ අෂූර් කෙරෙන්ද, මිසරයෙන්ද, පත්‍රෝසෙන්ද, කූෂ් රටෙන්ද, ඒලමෙන්ද, ෂීනාරෙන්ද, හමාතෙන්ද, මුහුදේ දිවයින් වලින්ද, ඉතිරිවන්නා වූ ස්වකීය සෙනඟ මුදාගන්නට ෆ දෙවැනිවර තමන් අත දිගු කරන සේක. උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා, පන්නනු ලැබූ, ඉශ්‍රායෙල්වරුන් රැස්කර විසුරුවනු ලැබූ යුදවරුන් පොළොවේ සතර කොනින් එකතු කරන සේක."**

ඉහත මෙම අනාගතවාක්‍යය යෙසායා විසින් පවසන කාලයේ ඉශ්‍රායෙල්වරු තම රටේ සුවසේ වාසය කළහ. එවකට ඔවුන්ව තම රටින් පන්නා දමනු ලැබ තිබුණේවත් නැත. යළි රැස්කරවීමක් පිළිබඳ යෙසායා කියන්නේ ඇයි දැයි ඔවුනට නොතේරෙන්නට ඇත. එහෙත් බොහෝ පෙර සිට දෙවියන්වහන්සේ සියල්ල සැලසුම් කර තිබෙන බව අපි දැන ගත යුතු වෙමු.

යෙසායා 43:5 සිට 7 පදය දක්වා මෙසේ සඳහන් වේ.

**"භයනොවන්න, මම නුඹ සමග සිටිමි. නුඹේ වංශය නැගෙනහිරින් ගෙනෙන්නෙමි. බස්නාහිරින්ද නුඹ රැස් කරන්නෙමි. මම උතුරු දිශාවට කතාකොට දියන්නැයි කියා ද, දකුණු දිශාවට නවත්වා නොගනින්නැයි කියා ද දුර සිට මාගේ පුත්‍රයන්ද, පොළොවේ කෙළවරින් මාගේ දූවරුන්ද ........ ගෙනෙන්නැයි කියා කියන්නෙමි".**

මෙම අනාගත වාක්‍යය අප ජීවත් වන මේ පරම්පරාව තුළදී වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉටුවිණි. තවද, මීට වසර 2600 පමණ පෙර යෙරෙමියා තුළින් දෙවියන්වහන්සේ මෙසේ පවසා තිබුණි.

යෙරෙමියා 16:14 සහ 15,

**"එහෙත් ස්වාමීන්වහන්සේ මෙසේ කියන සේක. ඉශ්‍රායෙල් පුත්‍රයන් මිසරදේශයෙන් ගෙනාවාවූ, ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබෑව සේම කියා තවත් නොකියා, ඉශ්‍රායෙල් පුත්‍රයන් උතුරු දේශයෙන්ද, උන්වහන්සේ**

**ඔවුන් පන්නා දැමූ, සියලු දේශවලින්ද ගෙනාවාවූ ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබෑවා සේම කියා කියන දවස් පැමිණෙන්නේය. මා විසින් ඔවුන්ගේ පියවරුන්ට දුන් ඔවුන්ගේ දේශයට ඔවුන් නැවත පමු ණුවන්නෙමි".**

යෙරමියා 32:37

**"බලව, මාගේ උදහසින්ද මාගේ කෝපයෙන්ද, තද අමනාපයෙන්ද මා විසින් ඔවුන් පන්නා දැමූ සියලු රටවලින් ඔවුන් රැස්කරගෙන නැවත මෙම ස්ථානයට කැඳවා සුවසේ වාසයකරන්නට සලස්වන්නෙමි".**

මෙවැනි අනාගත වාක්‍යය තවත් කිහිපයක්ම ශුද්ධ බයිබලයේ සඳහන්ව තිබේ. එබැවින්, විසිර ගොස් සිටියා වූ ඉශ්‍රායෙල් නැවත රටක් සහ ජාතියක් ලෙස පිබිදීම නියත ලෙසම සිදුවිය යුතුබව ශුද්ධ බයිබලය කියවූ, ඇදහූ අය පෙර සිටම දැන සිටියහ.

එසකියෙල් 11:17

**"එබැවින් ස්වාමී වූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේකැයි කියාපන්න, මම ජනයන් අතරෙන් නුඹලා එකතු කර නුඹලා විසිර සිටින දේශවලින් නුඹලා රැස් කොට ඉශ්‍රායෙල් රට නුඹලාට දෙන්නෙමි".**

**"ඉශ්‍රායෙල් රට නුඹලාට දෙන්නෙමි"** යන එම පොරොන්දුව ෙ සරුබ්බාබෙල් යටතේ ඉශ්‍රායෙල් ජනතාව වහල්කමෙන් මිදී ආ විට ඉටු වුයේ නැත. මන්ද ඔවුන් තවදුරටත් සිටියේ විදේශ ආධිපත්‍ය යටතේය. එහෙත් "ඉශ්‍රායෙල් රට නුඹලාට දෙන්නෙමි". යන අනාගත වාක්‍යය සම්පූ ර්ණ වුයේ 1948 මැයි 15 වැනිදය.

එසකියෙල් 36:24

**"එසේය, මම ජාතීන් අතරෙන් නුඹලා රැගෙන සියලු දේශවලින් නුඹලා රැස්කර නුඹලාගේම රටට ගෙනෙන්නෙමි".**

මෙම ඉහත සඳහන් අනාගත වාක්‍යය ඉටුවීම පසුපස ඇත්තේ අපූ රු කතාවකි. කිසිවකුත් සිහිනෙන්වත් නොසිතූ අයුරින් දෙවියන්වහන්සේ තම වචන ඉටුකර ලූයේ කෙසේද?

පළමුවන ලෝක මහා යුද්ධය කෙරීගෙන යන අතරතුරේ ඇතිවූ වෙඩි බෙහෙත් හිඟය නිසා මහා බ්‍රිතාන්‍යය තද අපහසුතාවයකට මුහුණ පෑවේය. දකුණු ඇමරිකාවෙන් ගෙන්වන ලද නයිට්රේට් වර්ගයකින් වෙඩි බෙහෙත් නිපදවන ලදී. එහෙත් ජර්මානු සබ්මැරීන විසින් මුහුදු ගමනාගමනයට බාධා පැමිණෙවූ බැවින් බ්‍රිතාන්‍යයට අවශ්‍ය වූ අමු ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි විය. වෙඩි බෙහෙත් නොමැතිනම් යුද්ධය පරදිනු නියතය. එහෙත් ඒ අවස්ථාවේ චයිම් වයිස්මන් (CHAIM WEIZMANN) නම් වූ අද්විතීය යුදෙව් විද්‍යාඥයා ක්‍රියාත්මක විණි. වායුගෝලයෙන් ගන්නා නයිට්‍රජන් වායුව භාවිතා කොට වෙඩි බෙහෙත් සෑදීමට අවශ්‍ය කරන අමු ද්‍රව්‍ය නිපදවා ගන්නා අකාරය ඔහු විසින් සොයා ගන්නා ලදී. මේ ආකාරයට වෙඩි බෙහෙත් හිඟය මග හරවා ගැනීමට බ්‍රිතාන්‍යට හැකිවිය.

යුද්ධය අවසාන වීමෙන් අනතුරුව බ්‍රිතාන්‍ය රජයට කළ මෙම මහත් සේවාව උදෙසා ගෞරවයක් වශයෙන් චයිම් වයිස්මන් මහතාට බ්‍රිතාන්‍ය රජය විසින් කළ යුත්තේ කුමක්දැයි ඔහුගෙන්ම විමසන ලදී. "මට මගේ රට දෙන්නැ"යි හෙතෙම පැවසුවේය. එයට අවනත වීමට බ්‍රිතාන්‍ය රජය තීරණය කරන ලදී. ඒ අනුව බැල්ෆර් ප්‍රකශනය එළිදැක්විණි. පලස්තීනයෙහි ඉශ්‍රායෙල් ජනතාවට නිජභූමියක් දීමට කටයුතු කරන බවට ඉන් පැවසිණි. එතැන් පටන් ලෝකය පුරා විසිරී සිටි ඉශ්‍රායෙල් ජනතාව ඉශ්‍රායෙල් රට වෙත ඇදී එන්නට පටන් ගත්හ. මෙසේ වසර කිහිපයක් ඇතුලත පෙර නොවූ විරූ ආකාරයට යුදෙව් ජනතාව පලස්තීන දේශය වෙත ඇදී ආහ. එහෙත් ඔවුන් පැමිණුනේ සුන්දර හා සහනදායි වාතාවරණයක් තුළට නොවේ. දේශයේ තැනින් තැන ගොවිපොළ ආශ්‍රිත ජනපද ගොඩනගමින් ඔවුන් ඉශ්‍රායෙල් දේශය ජනාකීර්ණ කළහ. ඔවුන්ගේ බොහෝ දෙනා අහිතකර සෞඛ්‍ය තත්වයන් යටතේ මරණයට පත් වූහ. හතර වටින් සිටියවූ විරුද්ධවාදී ජාතීන් වෙතින් එල්ල වූ ප්‍රහාර වලින් මියගිය සංඛ්‍යාව ගිණිය නොහැකිය. මැලේරියා රෝගය ඇතුලු තවත් බොහෝ රෝගවලින් මියගිය සංඛ්‍යාවද විශාලය. එහෙත් ඒ කිසිවකින් පසුබට නොවී සිව් දිගින් ඉශ්‍රායෙල් ජනයා පලස්තීන දේශය වෙත ඇදී ආහ. 1948 මැයි 14 වෙනිදා රාත්‍රී 12.00 ට බ්‍රිතාන්‍ය වෙත එක්සත් ජාතීන්ගේ සංගමය වෙතින් පැවරී තිබූ පලස්තීන

දේශයේ භාරකාරත්වය අවසන් වීමට නියමිතව තිබුණි. එදින මධ්‍යම රාත්‍රියේ බ්‍රිතාන්‍ය ධජය හකුලන මොහොතේම යුදෙව්වරු ඉශ්‍රායෙල් ධජය ඔසවමින් තමන් ස්වෛරී රාජ්‍යයක් බව ප්‍රකාශයට පත් කළහ. වසර 2500 ක් තිස්සේ වහල්කමේද, විසුරුවනු ලැබීමේද පීඩාවට යටත්ව සිටි ඉශ්‍රායෙල් ජාතිය මෙසේ 1948 මැයි 15 වෙනිදා රටක් හා ජාතියක් වශයෙන් යලි නිදහස ලැබීය. මතෙව් 24 වෙනි පරිච්ඡේදයෙහි ස්වාමී වූ යේසුස්වහන්සේ ප්‍රකාශ කළ අත්තික්කා ගහේ දළුලෑම ඇරඹී තිබෙන බව පැහැදිලිව පෙනෙන්න පටන් ගත්තේ ඉන්පසුවය. එතැන් පටන් අද දක්වා වසර 63 ක් තුළ ඉශ්‍රායෙල් දේශයේ සිදුවී ඇති විපර්යාසය අතිශයින් විශ්මයජනකය. කෘෂිකාර්මික, තාක්ෂණික, යුද්ධබලය සහ අවිආයුධ වැනි ක්ෂේත්‍රයන්හි ඉශ්‍රායලය ලබා ඇති ප්‍රගතිය අති මහත්ය. මුළු ලෝකයේම අවධානය පලස්තීන දේශයට යොමු වී තිබෙන්නට තරම් යලි උපත ලත් ඉශ්‍රායෙල් ජාතිය ලෝකයට මහා බලපෑමක් එල්ල කර ඇත. වර්තමානයේ දිනපතා ප්‍රවෘත්ති ප්‍රකාශණ වල ඉශ්‍රායලය සහ පලස්තීන දේශය ගැන නිතරම සඳහන් වෙනවා නොවේද? පසුගිය වසර 63 තුළදී ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳ වූ අනාගත වාක්‍ය කිහිපයක් අකුරටම ඉටුවූ අයුරු දැන් බලමු.

## 1. හෙබ්‍රෙව් භාෂාව නැවත පණගැන්වීම

**"ඉශ්‍රායෙල්ගේ දෙවිවූ සේනාවල ස්වාමින්වහන්සේ මෙසේ කියන සේක, මා විසින් ඔවුන්ගේ වහල්කම පහකළ කල්හි යුදා දේශයෙහිද, එහි නුවරවලද මනුෂ්‍යයින්, 'එම්බා ධර්මිෂ්ඨකමේ වාස භූමිය, එම්බා ශුද්ධකමේ කන්ද, නුඹට ස්වාමීන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා' යන කීම නැවත භාවිතා කරනවා ඇත" (යෙරෙමියා 31:23).**

මෙය හෙබ්‍රෙව් භාෂාවෙන් යුදෙව්වරුන් අතරේ ප්‍රකාශ කෙරෙන ආශිර්වාද වාක්‍යයකි. වසර 2500 ට වඩා දේව වචනය තුළ නිශ්ශබ්දව තිබූ මෙම අනාගත වාක්‍යය දැන් අපගේ ඇස් පනාපිටම ඉටු වී තිබේ. යුදෙව්වරු ඉශ්‍රායෙල් රටට ලෝකයේ නන් දෙසින් පිවිසුනු විට එහි භාෂා වියවුලක් හට ගති. ඇමෙරිකාවෙන් හා එංගලන්තයෙන් පැමිණී යුදෙව්වෝ ඉංග්‍රිසි භාෂාව කතා කරති. රුසියාවෙන් පැමිණියෝ රුසියානු

භාෂාවද, ප්‍රංශයෙන් පැමිණියෝ ප්‍රංශ භාෂාවද යනාදී වශයෙන් තම තමා පැමිණි රටවල භාෂාවලින් කතා කිරීමද හේතු කොටගෙන ඉශ්‍රායලයේ තිබුණේ මහා භාෂා වියවුලකි. එහෙත් මේ වියවුල කලින් දුටු **එලිය සර් බෙන්යෙහුඩා** නම් පුවත්පත් කලාවේදියා හෙබ්‍රෙව් භාෂාව යලි ප්‍රකෘතිමත් කිරීම පිණිස තම ජීවිත කාලය කැප කළේය. ක්‍රිස්තු පූර්ව 6 වන ශතවර්ෂයෙන් පසුව හෙබ්‍රෙව් භාෂාව පලස්තීන දේශයේ ප්‍රධාන භාෂාවක්ව පැවතුණේ නැත. පරණ ගිවිසුමෙහි ඇති වචන 7704 සිට ලක්ෂයක් පමණ වචන සංඛ්‍යාවක් දක්වා හෙබ්‍රෙව් භාෂාව වැඩිදියුණු කිරීමට බෙන්යෙහුඩා සමත් විය. අද තත්වය කෙසේද? දිනපතා පුවත්පත් 25 ට වැඩි ප්‍රමාණයක් හෙබ්‍රෙව් භාෂාවෙන් දැන් ප්‍රකාශයට පත් කෙරෙන අතර හෙබ්‍රෙව් භාෂාව සියලු යුදෙව්වරුන්ගේ පොදු භාෂාව බවට පත් වී ඇත. යෙරමියා 31:23 අකුරටම ඉටු වී ඇත.

## 2. දේශය නැවත සාරවත් වීම

**"වනාන්තරයද, වියළි දේශයද ප්‍රීතිවන්නේය. කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේය". (යෙසායා 35:1)**

පුරාණ බයිබල් යුගයේදි පලස්තීන දේශය කිරි හා මීපැණි ගලයන දේශයක් සේ හඳුන්වනු ලැබීය (නික්මයාම 3:8). මිදි පොකුරක් බර වැඩිකම නිසා දෙදෙනකු විසින් තඩලාගෙන යෑම සිදුවිණි (ගණන් කතාව 13:23). එහෙත් යුදෙව්වන් තම දේශයෙන් පන්නා දමනු ලැබීමෙන් පසු දේශයේ සාරවත්භාවය පිරිහී ගියේය. ශතවර්ෂ ගණනාවක් තිස්සේ රෝම, තුර්කි සහ අරාබි වැනි පාලන තන්ත්‍ර යටතේ දේශය පාලුකරයක් බවට පත් විය. 20 වෙනි ශතවර්ෂයේදී සිදු වූ යුදෙව්වරුන්ගේ පෙරලාගමනය සමගම යළි ඇතිවී තිබෙන්නේ පුදුම වෙනසක්ය. සැබවින්ම කාන්තාරය සෙව්වන්දි මෙන් මල් දරා තිබෙන හැටි අද අපට දැක ගත හැකිය. විවිධ තාක්ෂණික ක්‍රම, වාරිමාර්ග ක්‍රම භාවිතා කරමින් කෘෂිකර්මයේ ඇතිකර තිබෙන සංවර්ධනය මුලු ලෙවටම ආදර්ශයක් වී තිබේ. පළතුරු සහ මල්වර්ග අපනයනය කරන ප්‍රධාන රටක් බවට ඉශ්‍රායලය අද පත්ව ඇත. වසර 2000 ට වඩා පාලුවට හැර දමා තිබූ දේශයක් මෙවන් විශාල කෘෂිකාර්මික සංවර්ධනයක් ඉතා කෙටි කාලයකින් ලබා ගැනීම

ඇදහිය නොහැකි පුදුමයකි. දෙවියන්වහන්සේගේ හස්තය මේ පිටුපස තිබේ. යෙසායා 35:1 ඉටුවිය යුතුව තිබුණි.

## 3. වෘක්ෂලතා නැවත හටගැන්වීම

**"නුඹලා ජාතීන් අතරෙහි සාගතයෙහි නින්දාව තවත් නොලබන පිණිස මම ගස්වල ඵලද, කෙත්වල අස්වැන්නද වැඩිකරන්නෙමි". (එසකියෙල් 36:30)**

1948 දී නිදහස ලැබීමත් සමඟම මහා පරිමාණයේ පැළ සිටුවීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු දේශය පුරා ගස්කොළන් වැඩෙන්නට පටන් ගති. පළමුවන වසර 16 තුළ ගස් මිලියන 83 ක් සිටුවන ලදී. පයින් ගස් වනාන්තර අද ඉශ්‍රායෙල් රටේ විහිදී තිබෙන්නේ මේ හේතුවෙනි. පසුගිය වසර 60 තුළ සිදු වූ දේ සැබවින්ම පුදුම සහගතය. බයිබල් යුගවලදී මෙන් යලිත් අත්තික්කා, මරඳ, රෝතම් වැනි ගස් වර්ග ඉශ්‍රායෙල් දේශයේ දක්නට ලැබේ. පළතුරු පිටරට යැවීමේ ව්‍යාපාරය ඉශ්‍රායෙල් රාජ්‍යයට මහත් විදේශ විනිමයක් එකතු කර දෙයි. අප රට නිදහස ලබන අවදියෙහි, ඉශ්‍රායෙල් දේශයෙහි වූයේ කාන්තාර සහ පාලු වී ගිය මුඩු බිම් පමණකි. එහෙත් වසර 60 ට පසු තත්වය කෙතරම් විශ්මය ජනක ලෙස වෙනස් වී තිබේද? මෙය දෙවියන්වහන්සේගේ වචනය ඉටුවීමක් මිස මනුෂ්‍ය උත්සාහයෙන් පමණක් කළ හැකි දෙයක් නොවේ. ශුද්ධ බයිබලයෙහි අඩංගු සෑම අනාගත වාක්‍යයක්ම එක එක වචනයක් පාසා නියත ලෙසම ඉටුවන බව අපි දැනගත යුතු වෙමු.

## 4. නගර, පුරවරයන් නැවත ගොඩනගනු ලැබීම

**"ස්වාමී වූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක, නුඹලාගේ සියලු අපරාධවලින් මා විසින් නුඹලා පිරිසිදු කරන දවසේ මම නුවරවල මිනිසුන් වාසය කරවන්නෙමි. පාලු ඉඩම්ද ගොඩ නගනු ලබන්නෙහිය". (එසකියෙල් 36:33)**

මෙම අනාගත වාක්‍යයද පසුගිය වසර 60 තුළ දී ඉටු වී තිබෙන අයුරු එහි යන ඕනෑම කෙනෙකුට දැකිය හැක. ඉතා ක්‍රමවත්ව හා සංවිධානාත්මකව නගර නිර්මාණය කිරීමෙහිලා ඉශ්‍රායෙල්වරු ප්‍රමුඛයන් බව ලෙවට පෙන්වා තිබේ. යෙරුසලම, ටෙල්-අවිව්, හයිපා, කිරියත් ගැත් සහ අරාත් වැනි ජනාකීර්ණ සහ සැලසුම් සහගත නුවරවල් මීට කදිම නිදසුන්ය. අධිවේගී මාර්ග, ඒ මේ අතට ඇති ගුවන් පාලම් යෙදූ මාර්ග, දහස් සංඛ්‍යාත ගෙඩනැගිලි සහ තට්ටු නිවාස සහිත රටක් මෙපමණ කෙටි කාලයකින් කෙසේ ගොඩනැගෙන්දැයි සිතා ගත නොහැකි තරම්ය. එහෙත් දෙවියන්වහන්සේගේ වචනය ඉටු විය යුතුව තිබුණි.

## 1967 වසරේ දින හයේ යුද්ධය

1948 දී ඉශ්‍රායලය යලි උපත ලැබූ දිනයේ සිටම අවට සිටි අරාබි ජාතීන්ගේ සතුරුකම් විඳීමට ඉශ්‍රායෙල්ට සිදුවිය. අවසානයේ සුවස් ඇළ වසා දැමීමෙන්ද, අකබා බොක්ක ඉශ්‍රායෙල් නැව් සඳහා තහනම් කිරීමෙන්ද, පීඩා කරනු ලැබීය. යුද්ධයක් අත ළඟ බව අරාබි හමුදා ඒකරාශි කළ අයුරින් පෙනෙන්නට තිබිණි. මිසරයේ සොල්දාදුවන් 80,000 ක් සීනයි සීමාවටද, සිරියානු සොල්දාදුවන් 40,000 ක් උතුරෙන්ද, ජෝර්දාන හමුදාව 40,000 ක් නැගෙනහිරින්ද, සවුදි අරාබියාව හා ඉරාකය වෙතින් එවූ උපකාර බල ඇණිද ඉශ්‍රායලය වට කළහ. යුද්ධය ඇරඹීමට පෙර කයිරෝ ගුවන් විදුලිය මෙසේ ප්‍රකාශ කළේය. " මේ යුද්ධය එන තුරු වසර 20 ක් අපි බලා සිටියෙමු. ඉශ්‍රායෙල්ට මරණයේ පාඩම අපි දැන් උගන්වන්නෙමු". සිරියානු හමුදා නායකයා ප්‍රකාශ කළේ දින හතරකින් ඉශ්‍රායලය විනාශ කරන බවයි. දමස්කයේ ගුවන් විදුලිය සියලු අරාබි ජනතාවන්ගෙන් ඉල්ලා සිටියේ කාලකණ්ණි යුදෙව්වන්ගේ සිරුරු පලා හදවත පිටතට ඇද දූවිල්ලෙහි පගා දමන ලෙසය. දෙවියන්ගේ පිහිටෙන් අපි ඉශ්‍රායෙලය විනාශ කරන්නෙමු යැයි ඔවුහු එක හඬින් පැවසූහ. එහෙත් සිදු වූ දෙය ඊට හාත්පසින්ම වෙනස්ය. පැය කිහිපයක් ඇතුලත අවට රටවල ස්ථාන ගත කොට නවත්වා තිබූ යුධ ගුවන් යානා හාරසීයක් විනාශ කිරීමට ඉශ්‍රායලය සමත් විය. අරාබි ජාතීන් යුද්ධයෙන් පැරදුණේ මුළු ලෙවම මවිත කරවමිනි.

යුද්ධයේ දෙවැනි දවස වන විට පුරාණ යෙරුසලම් අල්ලා ගැනීමට ඉශ්‍රායල්වරු සමත් විය. පුරාණ යුදෙව් දේව මාළිගාව පිහිටා තිබුණේද එහි ය. ක්‍රි.ව 70 දි විනාශ කරන ලද එම දේව මාළිගාවෙහි එක බිත්තියක් තවම ඉතිරිව තිබේ. එතැන දක්වා තම හමුදා මෙහෙය වූ මෝශේ ඩයාන් නම්වූ ඉශ්‍රායෙල් හමුදා නායකයා එම බිත්තිය ඉදිරිපිට දණින් වැටී මෙසේ ප්‍රකාශ කලේය. "අද ජීවත්ව සිටින කිසිවකු අද අප ඉටු කළ මේ කර්තව්‍යය තරම් උතුම් වූ කර්තව්‍යයක් කර නැත". සැබැවින්ම ඉශ්‍රායෙල් වෙනුවෙන් දෙවියන්වහන්සේ යුද්ධ කළ බව කිව හැකිය. එම යුද්ධයේදී සිදු වූ ප්‍රාතිහාර්ය පිළිබඳ විවිධ පොත් ලියැවී තිබේ. යුද්ධ ඉතිහාසයේ කෙටිම යුද්ධය ලෙස හැඳින්විය හැකි දින හයේ යුද්ධය අනාගත වාක්‍යයමය වශයෙන් ඉතා වැදගත්මය යුද්ධය ලෙස සැලකිය හැකිය. මන්ද ඒ මගින් පුරාණ දේව මාළිගාව පිහිටි භූමිභාගය ඉශ්‍රායෙල් වරුන්ගේ පාලනයට යටත් කරනු ලැබූ නිසාය. අනාගත වාක්‍යය කාල සීමාවන් හැමවිටම ගණන් කරන්නේ පුරාණ යෙරුසලම් නගරයට සාපේක්ෂවය. එම නුවර අනාගත වාක්‍යයේ කේන්ද්‍රස්ථානය බව දානියෙල් 9:24 සිට 26 දක්වා පදවලින් ද සනාථ වේ.

**"මේ සියල්ල සිදුවන තුරු මේ පරම්පරාව පහව නොයන්නේ"** යැයි යේසුස්වහන්සේ පැවසූ සේක (මතෙව් 24:34). **"මේ පරම්පරාව"** ලෙස යේසුස්වහන්සේ හැඳින් වූයේ කුමන පරම්පරාවද? ඒ නම් අත්තික්කා ගහේ දළුලෑම දකින පරම්පරාවයි. අත්තික්කා ගහේ දළුලෑම දුටු පරම්පරාව අවසාන කාලයේදී සිදුවීම්ද, යේසුස්වහන්සේගේ දෙවන පැමිණීමද දකින පරම්පරාව යැයි කිව හැක. බයිබලයට අනුව පරම්පරාවක් වසර 40 ක්, 70ක් හෝ 100ක් යැයි ගණන් කළ හැක. ඇත්තටම අත්තික්කා ගහේ දළුලෑම ආරම්භ වූයේ 1948 වුවත් පුරාණ යෙරුසලම් නුවර අල්ලා ගනු ලැබුවේ 1967 දීය. එම නිසා එතැන් පටන් අවුරුදු 40 ක පරම්රාවක් අවසන් වන්නට තිබුණේ 2007 දීය. වසර 70ක පරම්පරාවක් නම් අවසාන වනුයේ 2037 දීය. එසේනම් අප ජීවත් වන්නේ ඉතා තීරණාත්මක අවධියක බව අපි දැනගත යුතු වෙමු.

## යොම්කිපූර් යුද්ධය

1973 ඔක්තෝම්බර් මාසයේ යොම්කිපූර් යුද්ධය නමින් තවත් යුද්ධයක් ඇවිලුණි. රුසියානු උපකාරය ඇතුව යුද ආයුධ යලි රැස්කර ගත් අරාබිකරය මුළු ඉශ්‍රායලයම නිවාඩු ගන්නා යොම්කිපූර් උත්සව දවසේදී ඉශ්‍රායලයට පහර දුන්හ. යුදෙව් යුධ උපක්‍රම පදනම් වී තිබුණේ බයිබලයේ පරණ ගිවිසුමේ සඳහන් යුධ ප්‍රවෘත්ති මතය. ඊජිප්තුවේ කයිරෝ නුවර වුවත් අල්වා ගැනීමේ හැකියාවක් ඉශ්‍රායලයට තිබෙන බව එම යුද්ධය කෙරීගෙන යන අතරතුරේ පෙනෙන්නට තිබිණි. කෙසේ වෙතත් ඇමරිකානු හා රුසියානු බලපෑම් මත යුද්ධය නවත්වන ලදී. දැන් මුළු යෙරුසලම් නගරයම ඉශ්‍රායෙල් සතුය. වර්තමානයේ ඉශ්‍රායෙල් යුද ශක්තිය අති මහත් බව නොරහසකි. න්‍යෂ්ටික අවි බලයද ඔවුන් සතුය. අත්තික්කා ගහ දැන් දළු ලා හමාරය. "**මේ දේ නුඹලා දකින කල දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟ බව දැන ගනිල්ලා**" යැයි යේසුස්වහන්සේ පැවසූ වචනවල කාලසීමාවෙහි අපි ජීවත් වෙමු. මේ පිළිබඳව තවත් එක් වැදගත් සාධකයක් තිබේ.

## දේව මාළිගාව යළි ගොඩනැගීම

ක්‍රිස්තු වර්ෂ 70 දී විනාශ කරදමන ලද, යෙරුසලමේ දේව මාළිගාව යලි ගොඩනැගීමේ දැවැන්ත උත්සාහයක ඉශ්‍රායෙල් රජයත්, යුදෙව් ආගමික නායකත්වයත් යෙදී සිටිති. යුදෙව් ආගමික අන්තවාදී පිරිස් දේව මාළිගාවේ මුල් ගල තැබීමට පවා මෑතකදී උත්සහ කළහ. අවසාන කාලයේදි විශේෂයන්ම මහා පීඩා කාලය තුළදී යෙරුසලමේ දේව මාළිගාව යලි ගොඩනගා තිබිය යුතු බව 2 තෙසලෝනික 2:4 න් පැහැදිලි වේ. එහි විරුද්ධ ක්‍රිස්තුස් පිළිබඳ මෙසේ සඳහන් වේ. "**ඔහු දෙවියන්වහන්සේ යැයි කියනු ලබන්නා වූ නොහොත් නමස්කාර කරනු ලබන්නා වූ සියල්ලන්ට විරුද්ධව සිට ඒ සියල්ලට වඩා තමාම උසස් කරගෙන දේව මාළිගාවේ වාඩි වී සිට තමා දෙවියන්වහන්සේ යැයි පෙන්වන්නේය".** දැනටමත් දේව මාලිගාව සැදීමට අවශ්‍ය කරන ගොඩනැගිලි ද්‍රව්‍ය සූදානම් කර තිබේ. එහෙත් දේව මාළිගාව නියමිත

ස්ථානයේ ගොඩනැගීමට තිබෙන බාධාවනම් 6 වන ශත වර්ෂයේ එම ස්ථානයේ ගොඩනගනු ලැබූ ඉස්ලාමීය දේවස්ථානය තවම එහි පිහිටා තිබීමයි. **ඩෝම් ඔප් ද රොක් සහ අල් අක්ෂා ඉස්ලාමීය ෙද්වස්ථාන** දෙක එම භූමි භාගයේ පිහිටා තිබෙන අතර ඒවා මක්කමට දෙවැනි අති පූජනීය ස්ථාන ලෙස ඉස්ලාම් අගම්කයන් විසින් සළකනු ලබති. මෙම ගොඩනැගිලි බිඳ දැමීමට එරෙහිව ලෝක ජනමතයක් තිබේ. එහෙත් දෙවියන්වහන්සේගේ වචනය නියත ලෙසම ඉටු වෙනවා ඇත. පුරාණ දේව මාළිගාව යලි ඒ නියමිත ස්ථානයේ ගොඩනැගීමට අවස්ථාව උදවන තුරු ඉශ්‍රායලය බලා සිටී. **අශේර් කව්ෆ්මන්** ප්‍රවීන පුරා විද්‍යාඥයා මෑතකදී කළ ප්‍රකාශය මෙහිදී ඉතා වැදගත් වේ. ඔහු පවසන්නේ, ඔහුගේ පුරා විද්‍ය පරීක්ෂණවලට අනුව මුස්ලිම් දේවස්ථාන බිඳ නොදමා දේව මාළිගාව පුරාණ බිමෙහිම ගොඩනැගිය හැකි බවයි. එහෙත් එසේ ගොඩනගන්නෙහි නම් අන්‍යජාතීන්ට වෙන් කර තිබූ පිටත මළුව අතහැර ගොඩනැගිය යුතු බව ඔහු පවසයි. මන්ද අන්‍යජාතීන් සඳහා වූ පිටත මළුව මුස්ලිම් දේවස්ථානය තිබෙන ස්ථානය දක්වා විහිදී යන නිසාය. මෙම තත්වය එළිදරව් 11:2 හි ඇති අනාගත වාක්‍ය සමඟ මනාවට ගැලපේ. **"මාළිගාවෙන් පිටත තිබෙන මළුව අන්‍ය ජාතීන්ට දී තිබෙන බැවින් ඒක නොමැන අතහැරපන්න"**. මේ නිසා අද පවතින පලස්තීන සාම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් පිටත මළුව නොමැති දේව මාළිගාවක් ගොඩනැගීමට අවසර ලැබීමට ඉඩ තිබේ. දැනටමත් තිබෙන දැඩි උනන්දුව, සුදනම සහ නවීන ගොඩනැගිලි තාක්ෂණය නිසා වසරක් වැනි කෙටි කාලසීමාවකදී එය ගොඩනගා අවසන් කල හැක. එහෙත් යේසුස්වහන්සේගේ වලාකුල් මතට පැමිණීමේ සිද්ධියට පෙර මෙය සිදුවීම් අත්‍යවශ්‍ය නැත. පීඩා කාලයේ මුල් භාගයේදී මෙය සිදුවිය හැකි බව මගේ විශ්වාසයයි. තවද දේව මාළිගාවේ සේවය සඳහා ලෙවී ගෝත්‍රයට අයිති පූජකයන් පුහුණු කරවීමේ දේවධර්ම විද්‍යාල දෙකක් ඉශ්‍රායලයේ පිහිටුවා තිබේ. පූජක ඇඳුම්, දේව මාළිගා තිර, සහ උපකරණ සියල්ලද සදා අවසන් කර

තිබේ. "මේ දෙය සිදුවෙන්ට පටන් ගන්න කළ නුඹලාගේ මිදීම ලං වූ බැවින් ඉහළ බලා හිස් ඔසවාපල්ලා" (ලූක් 21:28).


# 2
# රෝම අධිරාජ්‍යය යළි පිබිදීම

අප ජිවත් වන මෙම යුගයේ අවසාන කාලයට දැන් අප පැමිණ සිටින බවට ඇති තවත් හොඳම සාධකයක් නම් රෝම අධිරාජ්‍යය යලි හිස එසවීමයි. එවැනි දෙයක් ඇත්තටම සිදු වී තිබේ දැයි ඔබ මවිත වන්නට ඉඩ තිබේ. ඇත්තෙන්ම එය එසේය. යුරෝපාකරය නමින් අද අප දකින්නේ පුරාණ රෝම අධිරාජ්‍යය යළි පිබිදීමයි. මෙය පිළිබඳව කෙටි අධ්‍යනයක යෙදී කරුණු පැහැදිලිකර ගැනීම ඉතා වැදගත්ය.

මෙතෙක් ලෝකයේ පැවත තිබෙන්නේ ලෝක අධිරාජ්‍යයන් හතරක් පමණි. ඒවා නම් බබිලෝනි, මේද-පර්සියානු, ග්‍රීක සහ රෝම යනාදී වශයෙනි. ඇත්තෙන්ම මෙලොව පැවතිය හැක්කේ එම ලෝක අධිරාජ්‍යයන් හතර පමණක්ම බව ශුද්ධ බයිබලය විවෘතව ප්‍රකාශ කර තිබේ. යමෙකුට පස්වැනි ලෝක අධිරාජ්‍යයක් පිහිටු වීමට හැකිවේ නම් ශුද්ධ වූ බයිබලය විශ්වාස තැබිය නොහැකි ලියවිල්ලක් හැටියට දුරු කල හැකි වනු ඇත. දෙවියන්වහන්සේ මනුෂයාට මෙයින් විවෘත අභියෝගයක් දී තිබේ. පළමුවන ලෝක අධිරාජ්‍යය වන බබිලෝනි අධිරාජ්‍යයේ නෙබුකද්නෙෂර් අධිරාජයා රජකම් කල කාලයේ දනියෙල් නම් දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘ තුමෙක් තුළින් මෙම ලෝක අධිරාජ්‍යය සතර පිළිබඳ දෙවියන්වහන්සේ එළිදරව් කළ සේක. කරුණාකර දනියෙල් පොතේ 2 සහ 3 පරිච්ඡේද කියවා බලන්න. එදා එම අනාගත වාක්‍යයෙන් පැවසූ පරිදිම සියල්ල සිදු වූ බව ඉතිහාසය අපට සාක්ෂි දරයි. නෙබුකද්නෙෂර්ගේ මුණුබුරා වන බෙල්ෂෂර්

රජකම් කරන සමයේ එක රාත්‍රියකින් බබිලෝනි රාජ්‍යය බිඳ වැටිණි (දානියෙල් 5). ඉන් පසු බිහි වූයේ මේද-පර්සියානු අධිරාජ්‍යයයි. එය ඉන්දියාව දක්වාම පාලනය කල බවට ඉතිහාසය සාක්ෂි දරයි. එය ශුද්ධ බයිබලයේද සඳහන්ව තිබේ (එස්තර් 1:1). කලකට පසු එම

## ලෝක අධිරාජ්‍ය සතර




අධිරාජ්‍යයත් බිඳ වැටී මහා ඇලෙක්සැන්ඩර්ගේ නායකත්වයෙන් යුතු ග්‍රීක් අධිරාජ්‍යය බිහිවිය. ඔහුගේ අභාවයෙන් පසු ජෙනරාල්වරු හතර දෙනෙකු යටතට පත් කල ඔහුගේ අධිරාජ්‍යය රෝමයේ කායිසර්ගේ රජ පරම්පරා බලයට යටවිය. එතැන් පටන් දීර්ඝ කාලයක් ලෝකයේ පැවතුණේ රෝම අධිරාජ්‍යයයි.

ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පලස්තීන දේශයේ උපත ලැබුවේ

රෝම අධිරාජ්‍යය ලොව පාලනය කල සමයේය.

## ලෝක අධිරාජ්‍ය සතර

මෙම අධිරාජ්‍ය හතර පිළිබඳ අනාගත වාක්‍යය දෙනු ලැබුවේ නෙබුකද්නේශර් රජතුමා දුටු සිහිනයක් ආශ්‍රිතවය(දනියෙල් 2). මෙම සිහිනය පහදා දීමේ හැකියාව තිබුණේ දනියෙල්ට පමණයි. නෙබුකද්නෙශර් දුටු සිහිනයේ තිබූ මහා පිළිමයේ රන් හිස බබිලෝනි අධිරාජ්‍යයයි. රිදී පපුව හා අත් මේද-පර්සියානු අධිරාජ්‍යයයි. පිත්තල බඩ සහ කලව ග්‍රීක් අධිරාජ්‍යයයි. යකඩ පාද සහ ඇඟිලි රෝම අධිරාජ්‍යයයි. යකඩ පාද සහ ඇඟිලි වලින් සංකේතවත් වූ එම රෝම අධිරාජ්‍යය පිළිබඳව අපූර්ව අනාගත වාක්‍යයක් දනියෙල් 2:44 හි සඳහන් වේ. **"ඒ රජුන්ගේ දවස් වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ, කිසිකලක නැති නොවන්නා වූ රාජ්‍යයක් පිහිටු වන සේක. ඒ ආණ්ඩුව අන් සෙනගකට අත් හරිනු නොලබන්නේය".** මේ අනාගත වාක්‍යයට අනුව දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙලොව පිහිටුවන වකවානුවේදී සතර වැනි අධිරාජ්‍යය වූ රෝම අධිරාජ්‍යය මෙලොව තිබිය යුතු බව සඳහන් වේ. එහෙත් පස්වන ශත වර්ෂයේ කොටසක්ද 15 වැනි ශත වර්ෂයේදී ඉතිරි කොටස ද වශයෙන් රෝම අධිරාජ්‍යය බිඳ වැටුණු බව අපි දනිමු.

එහෙත් එම අධිරාජ්‍යයේ භූමි භාගයට අයිති රටවල් වෙන වෙනම බලවත්ව පැවතුණු බව නොරහසකි. රෝම අධිරාජ්‍යයේ කොටස්කරුවන් වූ පෘතුග්‍රීසි, ඕලන්ද හා ඉංග්‍රීසී යන ජාතීන් පසු කලෙක ශ්‍රී ලංකාව පවා ආක්‍රමණය කළහ. කෙසේ වෙතත් ලෝක අධිරාජ්‍යයක් වශයෙන් එම රටවල් බලවත් වූයේ නැත. එහෙත් දෙවැනි ලෝක මහා යු ද්ධයෙන් පසුව සිදු වූ දෙය පුදුම සහගතය. යුද්ධමය වශයෙන් හා දේශපාලනමය වශයෙන් කැඩී බිඳී වෙන්වී තිබූ යුරෝපාකරය කිසිවකු නොසිතූ අකාරයට යලි සමගිව එකට ගොඩනැගෙන්නට විණි. මෙය පු රාණ රෝම අධිරාජ්‍යයේ යලි පිබිදීමක් බව පෙනෙන්නට වැඩි කලක් ගත නොවීය. එය එසේ විය යුතුව තිබුණේ යැයි, බයිබල් අනාගතවාක්‍යය හැදෑරූ අය සැමදම දැන සිටියහ. ඒ දෙවියන්වහන් සේගේ රාජ්‍යය මිහි පිට ස්ථාපිත කරනු ලබන කාලයේදී රෝම අධිරාජ්‍යය බලවත්ව තිබිය යුතු බව දනියෙල් 2: 44 හි සඳහන්ව තිබෙන බැවිනි. **"ඒ රජු න්ගේ දවස්වලදී"** යැයි පැවසීමෙන් අදහස් වනුයේ රෝම අධිරාජ්‍යයේ අවසාන භාගය වන පාද සහ ඇඟිලි වලින් පෙන්නුම් කරනු ලැබූ

යුරෝපාකරයේ රජවරුන්ගේ එකමුතුවයි.

මුලින්ම 1968 දී රටවල් තුනක් එකතුව පිහිටුවාගත් යුරෝපා සමාජය, මේ වන විට රටවල් 25ක් එකතු වූ යුරෝපාකරය බවට පරිවර්ථනය වී තිබේ. **"ඒ රජුන්ගේ දවස්වලදී"** දෙවියන්වහන්සේ තමන් රාජ්‍යය පෙළොවේ පිහිටුවනවා ඇත. එසේ කරන්නේ ස්වාමී වූ යේසුස්වහන්සේ මෙලොවෙහි රජකම් කිරීම පිණිස පැමිණීමත් සමගයි. ලෝකයට ව්‍යාජ සාමයක් පිළිගන්වන්නට මේ යුගයේ කෙළවරදී මෙලොව එළි බසින විරුද්ධ ක්‍රිස්තුස් නමින් අප හඳුන්වන රාජ්‍ය තාන්ත්‍රිකයා බිහිවන්නේද මේ වර්තමාන යුරෝපාකරය හෙවත් යලි පිබිදුණු රෝම අධිරාජ්‍යය වෙතිනි.

## භේද-භින්න වීමේ සිට පොදු මුදල් භාවිතය දක්වා

1969 ජුලි 20ද නීල් ආම්ස්ට්‍රෝන් සහ එඩ්වින් ඕල්ඩ්‍රින් රැගත් ඇපලෝ 11 ගුවන් යානයේ ඊගල් නම් උප යානාව සඳ මත ගොඩ බැසීය. විනාඩි කිහිපයකට පසු ගගන ගාමී නීල් ආම්ස්ට්‍රෝන් තම වම් කකුල සඳ මත තැබීය. මනුෂ්‍ය ඉතිහාසයේ මෙවැනි දෙයක් සිදුවුයේ පළමු වතාවටය. තමාගේ පළමු පියවර සඳමත තබන අතර නීල් ආම්ස්ට්‍රෝන් මෙසේ පවසනු ගුවන් විදුලි ශබ්ද විකාශන යන්ත්‍ර තුලින් මුළු ලොවටම ඇසුනි. "මෙය එක මිනිසකුගේ කුඩා පියවරකි. එහෙත් මනුෂ්‍ය සංහතියේ මහා පිම්මකි". නිල් ආම්ස්ට්‍රෝන්ගේ මේ කියමන යුරෝපාකරයේ මෑතකදී සිදු වූ එක් සිද්ධියකට අදාල කිරීම උචිතය.

දිනය - 1999 ජනවාරි පළමුවෙනිදය.
සිද්ධිය - යුරෝපාකරය පොදු මුදල් භාවිතය ප්‍රකාශයට පත්කිරීමයි.

සමස්ත ලෝකයා සිතුවේ එය යුරෝපයේ ආර්ථික වාසිය සඳහා ගත් පියවරක් හැටියටය. එහෙත් අවසාන කාලය පිලිබඳව බයිබලීය අනාගත වාක්‍ය ඉටුවීම පිළිබඳව මෙය යෝධ පිම්මකි.

ස්වාමි වූ යේසුස්වහන්සේ මෙලොව සිටි කාලයේ එවකට දැන සිටි ලෝකයේද භාවිතා වූයේ පොදු මුදල් වර්ගයකි. ඒ රෝම අධිරාජයාගේ ලාංඡනය සහිත මුදල්ය. **"අදයම් මිලය මට පෙන්වාල්ලා**

**යැයි යේසුස්වහන්ස් කීසේක. ඔව්හු මස්සක් උන්වහන්සේ වෙතට ගෙනාවෝය. මේ රූපයත් සටහනත් කාගේදැයි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූසේක. කායිසර්ගේයැයි ඔවුහු කීවෝය"** (මතෙව් 22:19-20). ආසියාවට අයත් ඉශ්‍රායලයේ යෙරුසලම් නගරයේ භාවිතා වූයේ යුරෝපයේ රෝම අධිරාජයාගේ ලාංඡනය සහිත මුදල්ය. එවකට පොදු මුදල් භාවිතය තිබූ බවට එය නිදසුනකි. මෙවැනි තත්වයක් යළි උදා වී තිබේ. 1999 ජනවාරි පළමුවැනිදා පොදු මුදල් භාවිතය ආරම්භ කල යුරෝපාකරය 2002 ජනවාරි පළමුවැනිදා යුරෝ මුදල් නෝට්ටු භාවිතය ආරම්භ කළහ. අවුරුදු හයක් වැනි කෙටි කාලයකින් යුරෝ නම් වූ මේ මුදල් නෝට්ටු ව කෙතරම් තීරණාත්මක බලවේගයක් බවට පත්ව තිබේදැයි තේරුම් ගැනීමට හොඳ ආර්ථික විශේෂඥයෙක් වීමට අවශ්‍ය නැත. ඩොලරයට වඩා ස්ථාවරත්වයක් සහ වැඩි වටිනාකමක් ඇති යුරෝ යුරෝපාකරයට පොදු වූ මුදල් වර්ගයයි. යුරෝපාකරයේ රටවල් අතර දේශ සීමා තහංචි නැත. විදේශ විනිමය තහංචි නැත. රට අයත් නියෝජිතයන් එක පාර්ලිමේන්තුවක අසුන් ගනිති. ඒ යුරෝපා පාර්ලිමේන්තුවයි. විරුද්ධ ක්‍රිස්තුස් නැමති දේශපාලන නායකයා බිහිවන්නේ මෙම පාර්ලිමේන්තුවෙන් වීමට හොඳටම ඉඩ ඇත. **"මේ රජුන්ගේ දවස්වලදී"** දෙවියන්වහන්සේ තම රාජ්‍යය පිහිටු වන බව මතක තබා ගන්න.

| | |
|---|---|
| 1968 | - රෝම සමාජය |
| 1980 දශකය | - යුරෝපා ආර්ථික කොමිසම |
| 1993 | - යුරෝපා පොදු වෙළඳ පොළ |
| 1993 නොවැම්බර් | - යුරෝපාකරය |
| 1994 | - යුරෝපා මුදල් ආයතනය |
| 1999 | - යුරෝපා පොදු මුදල් |
| 2002 | - යුරෝ පොදු මුදල් නෝට්ටු භාවිතය |

යුරෝපාකරය නමින් හැඳින්වෙන රටවල් නම් ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය, ලුක්සම්බර්ග්, එංගලන්තය, අයර්ලන්තය, ඩෙන්මාර්කය, ග්‍රීසිය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඔස්ට්‍රියාව, පින්ලන්තය, ස්වීඩනය, පෝලන්තය, චෙක් සමුහආණ්ඩුව, ස්ලෝවෙකියාව, ස්ලෝවේනියාව, හංගේරියාව, ලිතුවේනියාව, ලැට්වියාව, එස්ලෝනියාව, මෝල්ටාව,

සහ සයිප්‍රසය වේ.

සැබැවින්ම පුරාණ රෝම අධිරාජ්‍යය යලි හිස ඔසවා ඇත. මෙය මෙසේ විය හැකි යැයි මීට වසර 50 ට පෙරවත් කිසිවකු සිහිනයකින්වත් බලාපොරොත්තු වූයේ නැත. එහෙත් දෙවියන්වහන්සේගේ වචනය ඉටු විය යුතුමය. දශක හතරක් යන විට සියල්ල සිදුවී හමාරය. යළි පිබිදුණු යුරෝපාකරය අප ඉදිරිපිට තිබේ. දැන් ඉතින් අවසාන කාලය පිළිබඳව දේව වචනයේ ඇති නොයකුත් අනාගත වක්‍යය ඉටු වීමට බාධාවක් හෝ පමාවක් නැත. දනියෙල් 2 වැනි පරිච්ඡේදයෙහි නෙබුකද්නෙශර් රජතුමා සිහිනයෙන් දුටු මහා පිළිමයේ ඇඟිලිවලින් පිළිබිඹු කෙරුණු රෝම අධිරාජ්‍යයේ අවසාන කාල වකවානුව දැන් එළඹී ඇත. දනියෙල් 2 හි සඳහන් ඇඟිලි දසයෙන් සංකේතවත් වූ රාජ්‍යය එකතුව එළිදරව් 13:1 හි මුහුදෙන් පැනනැගුණු මෘගයාගේ අං දසයෙන් පිළිබිඹු කෙරෙයි. එළිදරව් 13:1 සිට 10 දක්වා කියවා බලන්න. එහි විස්තර කෙරෙන මෘගයා විරුද්ධ ක්‍රිස්තුස් සහ යලි පිබිදුණු රෝම අධිරාජ්‍යය පිළිඹිබු කරයි. වර්තමාන යුරෝපාකරය රටවල් 25 කින් සැදී තිබේ. එය ප්‍රධාන වශයෙන් රාජ්‍ය දහයකට ගොනු කල හැක. නැගෙනහිර යුරෝපා රටවල් එක කණ්ඩායමක් ලෙසද අනෙක් ප්‍රධාන රටවල් වෙන වෙනමද ගත් කළ රාජ්‍යයන් දහයක් ලෙස නම් කළ හැක. එසේත් නැතිනම් විරුද්ධ ක්‍රිස්තුස් ලෝකයට ප්‍රකාශ වන අවස්ථාවේ යුරෝපා හවුලේ ඉතිරිව සිටිනුයේ රටවල් දසයක් පමණක් විය හැක. දනියෙල් 2 හි පිළිබිඹු වන ඇඟිලි දසයෙත්, එළිදරව් 13 හි මෘගයාගේ අං දසයෙත් තිබෙන සංකේතය දෙවියන්වහන්සේ ස්ථිර කර පෙන්නනවා ඇත.

## යේසුස්වහන්සේ පැමිණෙන සේක. ඔබ සූදානම්ද?

දනියෙල් 2.44 නැවත කියවා බලන්න. **"ඒ රජුන්ගේ දවස්වලදී ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසිකලක නැති නොවෙන්නාවූ රාජ්‍යයක් පිහිටුවන සේක".** එම රජවරුන්ගේ දවස් නම් රෝම අධිරාජ්‍යයේ දවස් බව අපි ඉහත පැහැදිලි කර ගතිමු. එම රෝම අධිරාජ්‍යය නම් පළමු ශතවර්ෂයේදී මේ ලොව තිබූ රෝම අධිරාජ්‍යය නොව, අපගේ කාලයේදී එනම් විසිවන ශත වර්ෂයේදී යලි හිස එස වූ රෝම අධිරාජ්‍යයයි. එ

බැවින් යුරෝපාකරයේ වර්තමාන බලවත්වීම සහ සන්ධාන ගත වීම දේව වචනයෙහි සඳහන් අනාගත වාක්‍යයට අනුකූලව සිදුවූ දෙයකි. දනියෙල් 2 හි නෙබුකද්නෙශර් රජතුමා සිහිනෙන් දුටු රූපයෙහි පාදවල ඇඟිලි කොටසින් පිළිබිඹු වන කාල වකවානුවට අපි දැන් අවතීර්ණ වී සිටින්නෙමු. එසේ නම් යේසුස්වහන්සේගේ රාජ්‍යය පොළවේ ස්ථාපිත කරන කාලය දැන් එළඹ ඇත. එයට ක්‍රිස්තුස්වහන්සේගේ සහස්‍ර (අවුරුදු දහසේ) පාලන කාලය යැයි කියනු ලැබේ. යේසුස්වහන්සේ පොළවේ රජකම් කිරීමට පැමිණීමට දැන් කාලය එළඹ තිබේ නම් ශුද්ධවන්තයන් ගෙන යෑම සඳහා උන්වහන්සේ වළාකුළු මතට පැමිණීම රට වඩා කොපමණ වැඩියෙන් ළංව නොතිබේද? එසේ නම් ලූක් 21:28 හි සඳහන්ව ඇති අවවාදය පිළිගන්න. **"මේ දේ සිදුවන්න පටන් ගන්න කල නුඹලාගේ මිදීම ළං වූ බැවින් ඉහළ බලා හිස් ඔසවපල්ලා".**

යේසුස්වහන්සේගේ සහස්‍ර රාජ්‍යය කාලය ආරම්භ වීමට ප්‍රථම මහා පීඩා කාලයක් මිහි පිට තිබෙනු ඇත. මතෙව් 24:21 හි සඳහන් එම පීඩා කාලය ආරම්භයට පෙර ස්වාමී වූ යේසුස්වහන්සේව සැබෑ ලෙස අදහාගෙන සිටින වුන් යේසුස්වහන්සේ විසින් ස්වර්ගයට ගෙන යනු ලබනවා ඇත. එළිදරව් 3.10, සහ 1 තෙසලෝනික 4:13 සිට 17 දක්වා කියවා බලන්න. මේ නිසා අප ජීවත් වනුයේ තීරණාත්මක කාල වකවානුවකයි. යේසුස්වහන්සේ හදිසියේම වළාකුළු මතට පැමිණෙනවා ඇත. එවිට ජීවත්ව සිටින ඇදහිලිවන්ත වූ අප ඇසිපිය හෙලන ක්ෂණයකින් ස්වර්ගයට ඇදගනු ලබනවා ඇත. **"මෙන්න නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝ නොසැතපෙන්නෙමුව. නමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින් ඇසිපිය හෙලන ක්ෂණයකින් අපි සියල්ලෝ වෙනස් කරණු ලබන්නෙමුව"** (1 කොරින්ති 15:51,52). **"එවිට ජීවත්ව ඉතුරුව සිටි අපි එක විටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ**

**සම්මුඛ වන පිණිස වළාකුළු වලින් අහසට ඇදගනු ලබන්නෙමුව"** (1 තෙසලෝනික4:18). මේ අපූර්ව සිදුවීම ඉතා නුදුරු අනාගතයේදී සිදුවනු ඇතැයි අපි විශ්වාස කරමුව. ඔබ සූදානම්ද?

# 3

# ලොව සතර දෙසට බෙදුනු යුද්ධ බලය

අප ජීවත් වන මෙම යුගය කිතුණු සභා යුගය හෙවත් අනුග්‍රහයේ යුගය ලෙස හඳුන්වනු ලබයි. මෙම යුගය අවසාන වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වළාකුළු මතට පැමිණීමත් සමඟය. මේ නිසා අප දැන් ජීවත් වන්නේ අවසාන කාලයේ යැයි යමෙකු පවසන විට ඉන් අදහස් වනුයේ මෙම සභා යුගයේ අවසාන කොටසෙහි අප ජීවත් වන වගයි. මෙම යුගයේ අවසානය කරා අප දැන් එළඹ ඇතැයි අපට ඉඟි කරන තවත් එක් වැදගත් සාධකයක් දේව වචනය අධ්‍යයනය කරන්නාට දැක ගත හැකිය. එය නම් ලෝකයේ යුධ හමුදා බලය භූගෝලමය වශයෙන් සතර දිශාවකට බෙදී පැවතීමයි. සභාව ඔසවා ගැනීමෙන් පසුව සිදුවන විරුද්ධ-ක්‍රිස්තුස්ගේ පාලන කාලයේ අග භාගය ගැන දනියෙල් පොතෙහි 11 පරිච්ඡේදයෙහි 36 වෙනි පදයේ සිට 45 වැනි පදය දක්වා ලියැ වී තිබෙන අනාගත වාක්‍යය අති වැදගත් වේ.

**"රජද තමාගේ කැමැත්තේ හැටියට කර, සියලු දෙවිවරුන්ට වඩා උසස්වී, උඩඟුවී, දෙවිවරුන්ගේ දෙවියන්වහන්සේටත් විරුද්ධව අපූර්ව දේ කරනවා ඇත. උදහස තීන්දුවෙන තුරු ද ඔහු සඵලවෙනවා ඇත. මක්නිසාද නියමය ඉෂ්ටවන්නේය. ඔහු තමාගේ පියවරුන්ගේ දෙවිවරුන් සලකන්නේවත් ස්ත්‍රීන්ගේ ආශාව හෝ වෙන කිසි දෙවිකෙනෙකු හෝ සලකන්නේවත් නැතුව සියල්ලන්ට විරුද්ධව උඩඟු වන්නේය. එහෙත් බලකොටු දෙවියාට නම් ඔහුගේ ස්ථානයේදී ඔහු ගෞරව දෙමින්, තමාගේ පියවරුන් ඇඳින නොගත් දෙවියකුට රන් රිදීවලින්ද මැණික්වලින්ද අගේ ඇති දේ වලින්ද ගෞරව දෙන්නේය. ඉතා සවි ඇති බලකොටුවලට අන්‍ය දෙවියකු ඇතුව ඔහු මෙසේ කරනවා ඇත. ඔහු පිළිගන්න අයට**

**ඔහු බොහෝ ගෞරව දී, බොහෝ දෙනකු කෙරෙහි ඔවුන් ආණ්ඩුකාරයන් කර, මුදලට රට බෙදුදෙනවා ඇත. තීන්දුවේ කාලයේදී දකුණු දිශාවේ රජ ඔහුට විරුද්ධව පැමිණෙන්නේය. නුමුත් උතුරු දිශාවේ රජ කුණාටුවක් මෙන් රථද අසරුවන්ද බොහෝ නැව්ද ඇතුව ඔහුට විරුද්ධව ඇවිත්, දේශවලට වැද ජලය මෙන් ගලාගෙන සැරෙන් පැමිණෙන්නේය". ඔහු අලංකාර දේශයටත් ඇතුල්වන්නේය. බොහෝ රටවල්ද වැටෙනවා ඇත. එහෙත් ඒදොම්ද මෝවබ්ද අම්මොන් පුත්‍රයන්ගේ ප්‍රධාන කොට්ඨාශයද ඔහුගේ අතින් ගැළවෙනවා ඇත. ඔහු තමාගේ අත් රටවල් කෙරෙහි දිගු කරන්නේය. මිසර දේශයද නොගැළවෙන්නේය. ඔහු මිසරයේ රන් රිදී නිධානද සියලු අගේ ඇති දේවල්ද කෙරෙහි බලය පවත්වන්නේය. ලූබ්වරුද කූෂ්වරුද ඔහුගේ අඩි පාරේ යන්නෝය. නුමුත් නැගෙනහිරින්ද, උතුරෙන්ද පැමිණෙන ආරංචිවලට ඔහු කැළඹී බොහෝදෙනෙක් නාස්ති කරන්ටත් සිඳ දමන්ටත් මහත් කෝපයෙන් පිටත්ව යන්නේය. ඔහු මාළිගා වැනිවූ තමාගේ කූඩාරම්, මුහුදටත් අලංකාර වූ කන්දටත් අතරෙහි පිහිටුවා, පසුව තමාගේ අන්තිමයට පැමිණෙන්නේය. කිසිවෙක්ද ඔහුට උපකාර නොකරන්නේය"** (දනියෙල් 11:36 සිට 45 දක්වා).

සමස්තයක් වශයෙන් දනියෙල් 11 අපූර්ව අනාගත වාක්‍යයමය පරිච්ඡේදයකි. සාක්ෂි දරණ සෑම කිතුණුවෙක්ම මෙම පරිච්ඡේදය පිළිබඳ යම් තරමේ හෝ අවබෝධයක් ඇතුව සිටිය යුතු වේ. එම පරිච්ඡේදයේ පළමුවන ලෝක අධිරාජ්‍යයේ සිට අද දවස දක්වා මධ්‍යධරණී සහ මැද පෙරදිග ලෝකයේ ඉතිහාසය සඳහන්ව තිබේ. එහෙත් අරුමය නම් එම විස්තර ලියනු ලැබුවේ එම ඉතිහාසය සිදුවීමට පෙරය. අකුරටම ඉටු වූ එවන් බොහෝ අනාගත වාක්‍ය බයිබලයෙහි සඳහන්ව තිබේ. උදාහරණ වශයෙන් දනියෙල් 11වැනි පරිච්ඡේදයෙහි දෙවැනි සහ තුන්වැනි පද ගත හැකිය. අහෂ්වේරොෂ්, කැම්බියුස්, දරියුස්, අර්තක්සස් යන රජවරු තුළින් දෙවැනි පදයෙහි අනාගත වාක්‍යය සම්පූර්ණ වූ අතර, තුන්වන පදයේ සඳහන් අනාගත වාක්‍යය ග්‍රීසියේ මහා ඇලෙක්සැන්ඩර් රජතුමා තුළින් ඉටුවිය. 36 පදයේ අනාගත වාක්‍යය අවසාන කාලයට අදාල බව පිළිගත් මතයයි. එහි **"තමාගේ කැමැත්තේ හැටියට කරන රජ"** නම් විරුද්ධ-ක්‍රිස්තුස් ලෙස හඳුනාගෙන තිබේ.

දනියෙල් 11: 36 සිට 45 දක්වා අවසන් කාලය පිළිබඳ වැදගත්

අනාගත වාක්‍යමය තොරතුරු සඳහන් වේ. යුධහමුද බලය භූගෝලමය වශයෙන් සතර අතට බෙදී තිබෙන බව ඉන් පැහැදිලි වේ.

1. ඔහු (විරුද්ධ ක්‍රිස්තුස්) හා ඔහුගේ හමුදාව(බටහිර හමුදාව)
2. දකුණු දිශාවේ රජ (40 වන පදය)
3. උතුරු දිශාවේ රජ (40 සහ 44 පද)
4. නැගෙනහිර දිශාවේ රජ (44 පදය)

## ඔහු (විරුද්ධ-ක්‍රිස්තුස්) හා ඔහුගේ හමුදාව

"ඔහු" යලි පිබිඳුණු රෝම අධිරාජ්‍යයේ නායකයාය. දානියෙල් 2හි "පාද ඇඟිලි" දානියෙල් 7හි "සතරවෙනි මෘගයාගේ අං දසය" සහ එළිදරව් 13 හි "මුහුදෙන් මතුවන මෘගයාගේ අං දසය" මගින් පිළිබිඹු වන්නේ එකම දෙයක්මය. එනම් යළි පිබිදුනු රෝම අධිරාජ්‍යය ය. ඒ වර්ථමාන යුරෝපාකරයයි. එබැවින් හමුදා බල සේනා සතරෙන් පළමු එක යුරෝපා හමුදා බලයයි. යුරෝපාකරයේ යුධහමුදමය හැකියාව සිතා ගැනීමට අපහසු තරම් විශාලය. මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය සහ ජර්මනිය වැනි න්‍යෂ්ටික බලය සහිත රටවල් ගණනාවක එකමුතුවකින් යුරෝපාකරය සෑදී තිබේ. නැවත ලෝක යුද්ධයක් හට ගැනුනොත් යුරෝපාකරයේ ඇති යුද්ධ බලයේ විශාලත්වය මොනවට පැහැදිලි වනු ඇත. දානියෙල් 11 වැනි පරිච්ඡේදයේ අවසන් කොටසේ (35 පදයේ සිට) විස්තර කෙරෙන විරුද්ධ ක්‍රිස්තුස් හා ඔහුගේ ක්‍රියාකාරකම් ද යුද්ධ හා උපායන්ද නියත ලෙසම ඉටුවන අනාගතවාක්‍යයෝ වෙති. දානියෙල් 2, 7 සහ එළිදරව් 13 යන පරිච්ඡේදයන්ද අධ්‍යයනය කරන්න.

## දකුණු දිශාවේ රජ

**"තීන්දුවේ කාලයේදී දකුණු දිසාවේ රජ පැමිණෙන්නේය"**. "දකුණු දිශාවේ රජ" යන මෙම ප්‍රකාශණය මෙම පරිච්ඡේදයේ හත්වතාවක් සඳහන්ව තිබේ. ඉන් හයක්ම ඉතිහාසයට එක් වී හමාරය. තව සිදුවීමට ඉතිරිව ඇත්තේ එක් අවස්ථාවක් පමණි.

සාමාන්‍යයෙන් දකුණු දිශාවේ රජයැයි දේව වචනයේ හඳුන්වනු ලබන්නේ මිසරයත්, මිසරවරුන්ගේ මිත්‍ර සේනාවත්ය. එහෙත් වර්තමානයේ "දකුණු දිශාවේ රජ" යන යෙදුම ර්ට වඩා පුළුල් අර්ථයක් ආරූඪ කරගෙන ඇතිබව පිළිගැනේ. මේ අනුව දකුණු දිශාවේ රජ යනු මිසරය පමණක් නොව සියලු අරාබි ජාතීන්ගේ එකමුතුවකි. සියලු ආරාබි ජාතින් එකමුතු කිරීම සඳහා හේතු වන වැදගත්ම සාධකය නම් ඉස්ලාමීය ආගමික ජ්වලිත භාවයයි. ඉස්ලාමිය ආගමික පදනම යටතේ එකමුතු වන මොවුහු ඛනිජ තෙල් ලෝකයට විකිණීමෙන් ලැබෙන මහා ධනස්කන්ධයෙන් පොහොසත්ව සිටිති. මුළු ලෝක ඉතිහාසයේම අරාබි ජාතීන්ගේ දියුණුවේත් බලයේත් උච්චම ස්ථානයට දැන් ඔවුන් පැමිණ ඇතැයි කිව හැකිය. බටහිර මිතුරු රටවලින් ලබා ගත් යුධ තාක්ෂණයෙන් සන්නද්ධව අවසන් යුද්ධය පැමිණෙන තෙක් ඔවුන් බලා සිටින්නා වැනිය. මෑතකදී සිදු වූ ගල්ෆ් යුද්ධය සහ ඉරාක ඉරාන යුද්ධය කරණකොටගෙන පෙර කිසිදු නොවූ විරූ ආකාර යුද්ධ අත්දැකීමකට ආරාබිකරය හසුවිනි. දැන් ඔවුන්ට අත්දැකීම් තිබේ. නවීන යුධආයුධ තිබේ. ආගමික උම්මත්තකභාවයෙන් ජීවිත පූජා කිරිමට කැමති හමුදුවක්ද සිටියි. දැන් අවශ්‍ය කරන්නේ ලෝක යුද්ධයකි. අප්‍රිකා මහද්විපයේ බොහෝ රටවල්ද ඔවුන්ට එකතු වෙනවා නොඅනුමානයි. දැන් දකුණු දිශාවේ රජ මහා බලවතකු සේ සිටියි.

## උතුරු දිශාවේ රජ

—

දනියෙල් 11:36 සිට 45 දක්වා විස්තර වන්නේ මෙම යුගයේ අවසාන භාගයේ ලොවේ පවතින යුද්ධමය හා දේශපාලනමය ගැටුම් පිළිබඳ විස්තරයයි. 40 සහ 44 පදවල "උතුරු දිශාවේ රජ", "උතුරෙන් පැමිණෙන ආරංචි" යන වගන්ති සඳහන් වේ. උතුරු දිශාවේ රජු යනු ඉශ්‍රායලයට උතුරෙන් පිහිටි රාජ්‍යයන් හා එහි නායකත්වයයි. ලෝක සිතියමක් ගෙන පරීක්ෂා කර බැලුවහොත් උතුරු දිශාවේ රජ යනු රුසියාව බව නිගමනය කිරීම අපහසු නොවේ. සිතියමේ ඉශ්‍රායලයේ යෙරුසලම් නුවර හරහා උතුරට රේඛාවක් ඇඳි විට එය රුසියාවේ මොස්කව් නුවර අසලින්ම යන බව ඔබට පෙනෙනු ඇත. කෙසේ වෙතත් උතුරු දිශාවේ රජ යනු රුසියාව පමණක්ම නොව උතුරේ බලවතා

වූ රුසියාව හා එකට සන්ධාන ගත වූ සියලු රාජ්‍යයන්හි එකතුව වේ. අවසාන කාලයේ රුසියාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ එසකියෙල් 38 සහ 39 පරිච්ඡේදවල අපූර්ව අනාගත වාක්‍යය සඳහන්ව තිබේ. **"තවද මනුෂ්‍ය පුත්‍රය නුඹ ගොග්ට විරුද්ධව අනාගත වාක්‍යය කියමින් ස්වාමී වූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේකැයි කියාපන්න. බලව රොෂ්හිද, මෙෂෙක්හිද, තුබල්හිද, අධිපතියා වන ගොග්, මම නුඹට විරුද්ධ වෙමි. මම නුඹ හරවා, නුඹ ඇද උතුරේ දුර ස්ථානවලින් නුඹ ගෙනෙවිත් ඉශ්‍රායෙල් කඳු පිටට පමුණුවා".....**(එසකියෙල් 39.1,2). උතුරේ දුර ස්ථානවල සිටින්නේ යැයි දෙවියන්වහන්සේ කියන ගොග් නම් අධිපතියා රොෂ්, මෙෂෙක් හා තුබල් හි අධිපතියා බව සඳහන්ව තිබේ. රොෂ් පසුව රුසියාව (RUSSIA) වූ බවත් මෙෂෙක් යනු මොස්කව් බවත් සමාන්‍ය පිළිගැනීමයි. සෝවියට් රුසියාව බිඳ වැටුණු නමුත් රුසියාව තවමත් ලොව සුපිරි බලවතෙකි. න්‍යෂ්ටික යුධ බලය ඔවුන් සතුව තිබේ. එසකියෙල් 38 හා 39 පරිච්ඡේදවල සඳහන් අනාගත වාක්‍යය තවම ඉටු වූයේ නැත. එය ඉටුවීමට කාලය සමීපව ඇති බව පමණක් දැන් අපට කිව හැක. දනියෙල් 11:40 හි සඳහන් ඇති පරිදි **"උතුරු දිශාවේ රජ කුණාටුවක් මෙන් රථද, අසරුවන්ද, බොහෝ නැව්ද ඇතුව ඔහුට විරුද්ධව ඇවිත් දේශවලට වැද ජලය මෙන් ගලාගෙන සැරෙන් පැමිණෙන්නේය"** යන අනාගත වාක්‍යය එසකියෙල් 38:39 හි සවිස්තරාත්මකව දැක්වේ.

ඉහත අනාගත වාක්‍යය ඉටුවීමේ ලකුණු දැන් පෙනෙන්නට තිබෙන නමුදු එය ඉටුවීම ඇසින් දැකගන්ට අපට නොලැබෙනු ඇත. මන්ද යේසුස්වහන්සේ පැමිණ මෙම සිදුවීම් වලට පෙරාතුව අප ස්වර්ගයට ගෙනයනු ලබන නිසාය. එහෙයින් මෙම ලකුණු සියල්ල දකින අපි ස්වාමීවූ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිය යුතු වෙමු.

## නැගෙනහිර දිශාවේ රජවරු

**"නමුත් නැගෙනහිරින්ද උතුරෙන්ද පැමිණෙන අරංචිවලට කැළඹී බොහෝ දෙනෙක් නාස්තිකරන්ටත් සිඳදමන්ටත් මහත් කෝපයෙන් පිටත්ව**

**යන්නේය" (දානියෙල්11:44).** විරුද්ධ ක්‍රිස්තුස්ගේ රාජ්‍යය සමයේ අවසන් භාගයේදී නැගෙනහිර දිශාවේ රජවරු ඔහුට විරුද්ධව පැමිණෙන බවට දේව වචනයෙහි සාක්ෂි තිබේ. **"නමුත් නැගෙනහිරින්ද උතුරෙන්ද පැමිණෙන අරංචිවලට ඔහු කැළඹී.......**" යන ප්‍රකාශනයේ නැගෙනහිර දිශාවෙන් විරුද්ධ ක්‍රිස්තුස්ට එරෙහිව බලවේගයක් පැමිණෙන බවට ඉඟියක් කරයි. මේ පිළිබඳව එළිදරව් පොතේ ස්ථාන දෙකක මෙසේ සඳහන් වේ. **"සවෙනියා තමාගේ පාත්‍රය මහා ගඟෙහි එනම් එප්‍රාත් ගඟෙහි වැගිරෙව්වේය. එවිට නැගෙනහිර දිශාවෙන් එන රජුන්ගේ මාර්ගය සාදනු ලබන පිණිස එහි වතුර සිඳී ගියේය**" (එළිදරව් 16:12). මහා පීඩා කාලය තුළදී නැගෙනහිර දිශාවේ සිට එප්‍රාත් ගඟ හරහා පලස්තීන දේශය දෙසට රජුන් හා හමුදුවක් පැමිණෙනු ඇත. නැගෙනහිර දිශාවේ රජවරුන් මගින් චීනය ප්‍රමුඛ ඉන්දියාව, ජපානය ඇතුළු අසියාතික රටවල් අදහස් වන බව පිළිගත හැකිය. එළිදරව් 9:12 සිට 16 දක්වා මේ පිළිබඳව තවත් විස්තර පැහැදිලි කරයි. එහි 15,16 වැනි පද මෙසේය, **"එවිට මනුෂ්‍යයන්ගෙන් තුනෙන් පංගුවක් මරණ පිණිස නියම පැයටත්, දවසටත්, මාසයටත්, අවුරුද්දටත් සූදානම් කරනු ලැබ සිටි ඒ දූතයන් සතර දෙනා මරනු ලැබුවෝය. අසරු සේනාවෝ විසිකෝටියක්ය. ඔවුන්ගේ ගණන කියනවා ඇසුණි".**

ඉහත අනාගත වාක්‍යයේ සඳහන් පරිදි නැගෙනහිර දිශාවෙන් පැමිණෙන හමුදා සේනාවේ ගණන විසිකෝටියක් බව ප්‍රකාශ වේ. යොහාන් තුමා මෙසේ ලියුවේ පළවන ශත වර්ෂයේදීය. එවකට විසිකෝටියක හමුදා බලයක් පිළිබඳව සිතා ගැනීමටත් නොහැකි තත්වයත් තිබෙන්නට ඇත. එහෙත් යොහාන්තුමා ඉතා විශ්වාසවන්තව එම ගණන සටහන් කළේය. දැන් වසර දෙදහසකට පසු විසිකෝටියක හමුදුවක් ඇති එක රටක් ලෝකයේ තිබේ. ඒ චීනයයි. ඇත්තෙන්ම චීනයේ සම්පූර්ණ හමුදා බලය විසිකෝටියක් නොහොත් මිලියන දෙසීයක් බවට පත්වූයේ 1965 දීය. එය මීට වසර දෙදහකට ප්‍රථමයෙන් කිසිදු අයුරකින් සිතා ගැනීමට නොහැකි වූවකි. මෙවන් විශාල හමුදා බලයක් වර්තමානයේ චීනයට හිමිවී තිබීමෙන් ගම්‍ය වන්නේ කුමක්ද? දෙවියන්වහන්සේගේ වචනය ඉතාමත් නිවැරදි බව නොවේද? එහි සඳහන් අනාගත වාක්‍යය නියත ලෙසම ඉටු වනවා ඇත. නැගෙනහිර දිශාවේ රටවල් ලෙස ගැනෙන ජපානය හා ඉන්දියාවේ දැන් පවතින තාක්ෂණික දියුණුවත්, ආර්ථික වර්ධන වේගයත් මෙම අනාගත වාක්‍ය සම්පූර්ණ වීමකී.

මෙම රටවල් එකතු වූ විට විසිකෝටියක හමුදවක් රැස්කර ගැනීමත් පලස්තීන දේශය කරා ඔවුන් මෙහෙයවීමත් අපහසු කාර්යයක් නොවනු ඇත. උතුරු, දකුණු හා නැගෙනහිර දිශාවේ රජවරු පිළිබඳ දනියෙල් 11 හි සඳහන්ව තිබෙන අතර ඔවුන් අවසානයේ දී විරුද්ධ ක්‍රිස්තුස්ට එරෙහිව පැමිණීමෙන් අවසාන ලෝක මහා යුද්ධය අරම්භ වනු ඇත. එය සිදුවන්නේ පලස්තීන දේශය කේන්ද්‍රස්ථානය කරගෙනය. ස්වාමී වූ යේසුස්වහන්සේ මෙලොවේ රජකම් කරන්නට පැමිණෙනුයේ මෙම යුද්ධය අවස්ථාවේදීය. සෙකරියා 14:1 සිට 16 දක්වා කියවා බැලීම මෙහිදී වැදගත් වේ. **"ඒ කාලයේදී උන්වහන්සේගේ පාද යෙරුසලමට ඉදිරිපිටින් නැගෙනහිරින් තිබෙන ඔලීව කන්ද පිට තිබෙනවා ඇත. එවිට ඔලීව කන්ද නැගෙනහිර දෙසටත් බස්නාහිර දෙසටත් මැදින් පැලී මහත් මිටියාවතක් වන්නෙහිය. කන්දෙන් භාගයක් උතුරු දෙසටත් අනෙක් භාගය දකුණු දෙසටත් අහක්ව යනවා ඇත" (සෙකරියා 14:4).** පීඩා කාලය අවසානයේදි පොළොවේ රජකම් කිරිම පිණිස යේසුස්වහන්සේගේ පැමිණීම සිදුවන්නේ එසේයි.

බයිබලයේ විවිධ ස්ථානවල මේ පිළිබඳව කියැවෙන අනාගත වාක්‍යය සංසන්දනය කොට පහත සඳහන් සිදුවීම් ලයිස්තුව ගොඩනගා ගත හැකිය.

❖ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වළාකුළු මතට පැමිණීම.

❖ යේසුස් වහන්සේ කෙරෙහි අදහන්නවුන් ඉහලට ඔසවා ගනු ලැබ යේසුස්වහන්සේ සමග ස්වර්ගයට යෑම.

❖ ලෝකයේ පීඩා කාලය පටන් ගැනීම.

❖ විරුද්ධ ක්‍රිස්තුස් නොහොත් විනාශයේ පුත්‍රයා ලෙවට එළිදරව් වීම.

❖ රාජ්‍යයන් අතර කෙටි සාම කාලයක් පැවතීම.

❖ සාමය බිඳවැටී යුධ කෝලහල මගින් විශාල හානි සිදු වීම.

❖ දෙවියන්වහන්සේගේ දඬුවම ලෝකයා පිට පතිත වීමෙන් පෙර නොවූ විරූ ආකාරයට මිනිසා පීඩාවට ලක්වීම.

❖ උතුරු දිශාවේ රජද, දකුණු දිශාවේ රජද, නැගෙනහිර දිශාෙ

වන්      එන රජවරුද විරුද්ධ ක්‍රිස්තුස්ට එරෙහිව පැමිණීම.

❖ අවසාන ලෝක මහා යුද්ධය පලස්තීන දේශය කේන්ද්‍ර කොටගෙන      හට ගැනීම.

❖ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොලොවේ රජකම් කිරීම පිණිස පැමිණීම.

**“ස්වාමී වූ යේසුස්වහන්සේ තමන්ගේ පරාක්‍රමයේ දූතයන් සමඟ ඇවිලෙන්නාවූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එළිදරව් වී.....” (2 තෙසලෝනික 1:6).** මෙම අවස්ථාවේදී මැදපෙරදිගට රැස්වී සිටින ලොව සතර දිග යුද සේනාවන් තේජසින් යුක්තව එළිදරව් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේට එරෙහිව පෙළඹවීමට යක්ෂයාටත් විරුද්ධ ක්‍රිස්තුස්ටත් හැකියාව ලැබේ. පිටසක්වලින් එන ආක්‍රමණිකයකු ලෙස උන්වහන්සේවත් උන්වහන්සේගේ දූතසේනාවත් හඳුන්වා උන්වහන්සේට එරෙහිව යුධ වැදීමට සියලු හමුදාවන් පොළඹවනු ඇත. එහි අවසාන ප්‍රතිඵලය විරුද්ධ ක්‍රිස්තුස් නොහොත් මෘගයාගේ හා එම හමුදාවන්ගේ විනාශය යි. **“ස්වාමී වූ යේසුස් වහන්සේ තමන්ගේ හුස්මෙන් ඔවුන් නසා තමන්ගේ ඊමේ ප්‍රකාශවීමෙන් ඔවුන් නාස්ති කරන සේක”** (2තෙසලෝනික 2:8).

වර්තමාන ලොවේ යුධ බලය දනියෙල් 11හි 36 සිට 45 දක්වා

ඇති අනාගත වාක්‍යයේ සඳහන්ව ඇති ආකාරයටම භූගෝලමය වශයෙන් සතර දිශාවකට බෙදී වෙන්වී පවතී. අප දැන් ජීවත් වනුයේ අවසාන කාලයේ බවට මෙය කදිම දර්ශකයකි. අප දැන් වෙන කවදාටත් වඩා, වලාකුළු මතට පැමිණෙන යේසුස්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටිය යුතු වෙමු. උන්වහන්සේ වලාකුළු මතට පැමිණෙන්නේ අප ස්වර්ගයට ඔසවා ගැනීම පිණිසයි.

# 4

# පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාසය

20 වන ශත වර්ෂයේ මැද භාගයේ පමණ සිට පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාසයක් ලෝකය පුරා ප්‍රචලිත වන්නට විය. අප ජීවත් වන විශ්වයේ සූර්යයෝ අසංඛ්‍ය ගණනක් වෙති. එම එක එක සූර්යයා අවට භ්‍රමණය වන ග්‍රහලෝක ගණන කියා නිම කල නොහැකි තරම් අති විශාලය. අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ බුධ, සිකුරු, සෙනසුරු වැනි ග්‍රහලෝක පිහිටා තිබෙන නමුදු ජීවීන් සිටින්නේ පෘතුවිය මතුපිට පමණි. එහෙත් විශ්වයේ කොතැනක හෝ තවත් ග්‍රහලෝකයක ජීවීන් සිටිනු ඇතැයි මතවාදයක්ද, විශ්වාසයක්ද ගොඩනැගී තිබේ. එකදු භෞතිකමය සාක්ෂියක් නොමැති නමුදු පිටසක්වල ජීවීන් සහ ඔවුන්ගේ ගගන යානා (පියාඹන පීරිසි) පිළිබඳ කතා බොහෝය.

පිටසක්වල ජීවීන් මෙලොව ආක්‍රමණය කරණු ඇතැයි යන විශ්වාසය දැන් කුඩා දරුවකු තුළ පවා නිධන් ගතවී තිබේ. කුඩා ළමුන් නරඹන කාටූන් රූපවාහිනී දර්ශන බොහෝමයක් පිටසක්වල ජීවීන් ඇතැයි යන මතවාදය ඉස්මතු කර පෙන්වයි. මෙම තත්වය යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට ලෝක පරිසරය සහ වාතාවරණය සූදානම් කිරීමක් වැනිය. මන්ද ස්වාමී වූ යේසුස්වහන්සේ වළාකුළු මතට

පැමිණ සභාව ඔසවා ගත් විට එය පිටසක්වල ජීවීන්ගේ ආක්‍රමණයක් ලෙස ද අතුරුදහන් වුවන් එම පිටසක්වල ජීවීන් විසින් ඩැහැගෙන යන්නට ඇතැයිද පැහැදිලි කරදෙනු ඇත. එම සාවද්‍ය පැහැදිලි කර දීම ලෝකයා විසින් පිළිගනු ලබනු ඇත. බොරුවක් වුවත් එය විශ්වාස කිරීමට තරම් මිනිසුන් මුලාවනු ඇත. **“මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්න වූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුලාවේ ක්‍රියාකිරීමක් ඔවුන්ට එවන සේක” (2 තෙසලෝනික 2:11,12).** මෙම සිදුවීම සඳහා වර්තමාන ලෝකය සූදනම් කරනු වස් පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාසය ලොව මුළුල්ලේ ප්‍රචලිත වී තිබේ.

## පිටසක්වල වෙසෙන ජීවීන්

______පිටසක්වල ජීවීන් සිටිත්ද? එසේනම් ඔවුන් සිටින්නේ කුමන ග්‍රහලෝකයේද? බයිබලය කියවා, අධ්‍යනය කොට විශ්වාස කරන අය මෙම පැණයන්ට පිළිතුරු සොයාගෙන තිබේ. පිටසක්වල බොහෝ ජීවීන් සිටින බව ශුද්ධ බයිබලය ප්‍රකාශ කරයි. එහෙත් ඒ ජීවීන්, ඔබ මා සිතන ආකාරයේ ජීවීන් නොවේ. ඔවුන් නම් දෙවියන්වහන්සේගේ දූත සේනාව හා යක්ෂයාගේ දූත සේනාවන්ය. ස්වර්ගයේ සිටි දේව දූත සේනාවෙන් තුනෙන් එකක් පමණ ලුසිෆර් නම් වූ සාතන් සමග පහත හෙලනු ලැබූ බව තේරුම් ගැනීමට තරම් සාධක ශුද්ධ බයිබලයේ තිබේ. දෙවියන්වහන්සේගේ දූත සේනාවත් සාතන්ගේ දූත සේනාවත් හැරුණු කොට වෙනත් ජීවීන් මේ මුළු සක්වලේ ජීවත් වන්නේ නැත. දෙවියන් වහන්සේගේ දූතයන් පිටසක්වල ජීවීන් ලෙස පොළවේ දර්ශනය වූ කැපී පෙනෙන එක අවස්ථාවක් තමා එසකියෙල් 1 වන පරිච්ඡේදය. කරුණාකර එම දේව වචන කොටස කියවන්න. භයංකර හා දීප්තිමත් විශාල චක්‍ර හා වේගයෙන් ගමන් කරන ආලෝක කදම්භ ගැන එහි විස්තර වේ. එය දෙවියන්වහන්සේගේ තේජෝමහිමය පිළිබඳ විස්තරයකි. එහි දර්ශනය වනුයේ කෙරුබ්වරු නැමති දූත විශේෂයයි. වර්තමානයේ මිනිසුන් දැක තිබේ යැයි කියන පියාඹන පීරිසිවල විස්තරයට තරමක් සමාන වූ විස්තරයක් එසකියෙල් 1 වන පරිච්ඡේදයේ තිබේ.

දෙවියන්වහන්සේගේ දූත සේනාවන් සිටින්නේ ස්වර්ගයෙහිය. දෙවියන්වහන්සේගේ අණ පිට ඔවුන් පොළවට පැමිණි ඇතැම් අවස්ථාවන් ගැන බයිබලයේ සඳහන්ව තිබේ. එවන් බොහෝ අවස්ථාවන් අතුරින් උදාහරණ දෙකක් වශයෙන් ආබ්‍රහම් හමුවීමට පැමිණි ස්වර්ගීක අමුත්තන් (උත්පත්ති 18) සහ යේසුස්වහන්ස්ගේ උත්පත්තිය ගැන ප්‍රකාශ කිරීමට මරියා වෙත පැමිණි ගාබ්‍රියෙල් දේව දූතයා (ලූක් 1:26-38) සැලකිය හැකිය.

යක්ෂයාගේ වර්තමාන වාසභවන අකාශයයි. මේ නිසා ඔහුට **"අකාශයේ බලයේ අධිපතියා"** යන නම ආරූඪ කර ඇත (එපීස 2:2). **"ස්වර්ගීක ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාව"** (එපීස 6:12) ලෙසද යක්ෂයාගේ දූතයන් හඳුන්වා තිබේ. ඇතැම් අවස්ථාවකදී පොළොව මතුපිට දී යක්ෂ දූතයන් දර්ශනය වීම අදත් සිදුවිය හැකිය. එහෙත් එය සුලභව දක්නට නොලැබේ. යක්ෂයා සැම විටම කරන්නාක් මෙන් තමාගේ නියම ස්වරූපය නොපෙන්වා පිටසක්වල ජීවීන් සිටිතැයි මිත්‍යා විශ්වාසයක් ගොඩනගා තිබේ. අවසාන කාලයේ මුලා කිරීම් සිදු කරන්නට දෙවියන්වහන්සේ යක්ෂයාට ඉඩ දෙන බැවින් ඔහු තම බොරු වලින් ලෝකයා මුලා කරයි. යක්ෂයාම පිටසක්වල ජීවීන් ලෙස පෙනී සිටිමින් මනුෂ්‍යයා මුලා කල ඇතැම් අවස්ථා වාර්තා වී තිබේ. පිටසක්වල ජීවීන් මුණ ගැසීම ගැන මිනිසුන් ගොතන වාර්තා කියවා බැලීමේදී එම ජීවීන් හැම විටම භයංකර පිළිකුල් සහගත පෙනුමක් ඇති අය ලෙස සඳහන් කර තිබේ. ඇතැම් වාර්තාවල දෙවියන්වහන්සේටත් ශුද්ධ බයිබලයටත් එරෙහිව කල ප්‍රකාශයන්ද, පරිණාම වාදයට සහයෝගය දක්වන ප්‍රකාශයන්ද සඳහන්ව තිබේ. මිහිපිට මිනිසා ජනිත කරවනු ලැබුවේ දෙවියන්වහන්සේ නොව පිටසක්වල ජීවීන්ගේ ක්‍රියාකාර කමකින් යැයි ඇතැම් වාර්තා සඳහන් කරයි. එම නිසා මෙයට යක්ෂයාගේ ඇති සම්බන්ධකම අපට හඳුනා ගත හැක.

අවසාන කාල වකවානුව ගැන යේසුස්වහන්සේ ප්‍රකාශකල අනාවැකි කිහිපයක් ලූක් 21: 10 සහ 11 පදවල සඳහන් වේ. "ජාතියක් ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද විරුද්ධව නැගිටිනවා ඇත. මහත් භූමිකම්පාද නොයෙක් තැන්වල සාගත හා වසංගතද වන්නේය. **<u>භයංකර පෙනීම්ද, අහසින් මහත් ලකුණුද වන්නේය</u>**".

## සත්‍ය සිද්ධීන්

**"සෝෂලිස්ට් ඉන්ඩස්ට්‍රි"** නම් වූ රුසියානු පුවත් පතෙහි 1989 සැප්තැම්බර් 30 වැනිදා එක්තරා වාර්තාවක් පළවිය. එය මෙසේයි. 1989 මාර්තු 21 ද රාත්‍රියේ බයිලෝ රුසියා හි බොරිසෝස් නගරයට ඉහළ අහසේ සෝවියට් ජෙට් යානා දෙකක් පුහුණු වීමක නිරත විය. ඉන් එකක නියමුවන් තමාට නුදුරින් හදිසියේම පෙනෙන්නට පටන් ගත් අමුතු මාදිලියේ අහස් යානාවක් පිළිබඳ සෝවියට් පාලක මැදිරියට දැනුම් දුනි. එය අධික වේගයෙන් කැරකෙන පැතලි ස්වරූපයක් ගත් යානයක් වූ අතර ආලෝක කදම්භ තුනක් පහළටත් දෙකක් ඉහළටත් යන වශයෙන් දිස්වන බව දන්වා සිටියහ. එම යානය දෙසට ගමන් කිරීමට පාලක මැදිරියෙන් අණ ලැබීමෙන් අනතුරුව එදෙසට ගමන් කරත්ම එක ආලෝක කදම්භයක් තම ජෙට් යානයේ ගගන කුටිය වෙතට යොමු වූ බව ඔවුහු දන්වා සිටියහ. ඉන් තමා සිටි ස්ථානය ආලෝකමත් වූ අතර ඔවුන් ගේ ශරීරවලට රස්නය දැනුනි. සුලු මොහොතකින් එම නාඳුනන යානය නොහොත් පියාඹන පිරිසිය දුරට ඇදී ගොස් නොපෙනී ගියේය. ජෙට් යානය පැදවූ අණ දෙන නිළධාරියා මාස කිහිපයක් ඇතුළත මරණයට පත් විය. ඔහුගේ මරණ සහතිකයේ මරණයට හේතුව වශයෙන් සඳහන් වූයේ නාඳුනන පියාඹන යානයකින් නිකුත් වූ විකිරණශීලීතාවය හේතු කොට ගෙන හටගත් පිළිකාවක් බවයි. ඔවුන්ගේ සහායක නියමුවා ද රෝගාතුර වූ අතර නිතර සිහි මුර්ච්ඡා වීම් වලට භාජනය විය.

1999 ජූලි 16 වැනිදා ප්‍රංශයේ ජාතික ආරක්ෂාව පිළිබද උසස් අධ්‍යාපන ආයතනය මගින් වැදගත් ලියවිල්ලක් ප්‍රකාශයට පත් කර ප්‍රංශ ජනාධිපති ජැකස් චිරාක් මහතාට පිලිගන්වනු ලැබීය. එහි සදහන් වූයේ ලෝකය පුරා වාර්තා වී ඇති නාඳුනන පියාඹන යන්ත්‍ර හෝ යානා පිළිබඳ පූර්ණ විග්‍රහයකි. එපමණක් නොව ලෝකයේ සෑම දියුණු රටකම නාඳුනන පියාඹන යන්ත්‍ර දර්ශනය වීම සොයා බැලීමට විශේෂඥයන් පත්කර, ආයතනද පිහිටුවා තිබේ.

ඉහත සාධක සලකා බැලූ විට පෙනී යන්නේ පිටසක්වල ජීවීන්

පිළිබඳ ප්‍රකාශණ සෑම විටම සිතින් මවා ගත් ඒවා හෝ වෙනත් සධාරණ පැහැදිලි කිරීමක් ඇති සිද්ධීන් නොවන බවයි. පැහැදිලිවම යම් දෙයක් සිදු වෙමින් පවතී. යක්ෂයා තම අවසන් මුලව මෙලොව ප්‍රචලිත කරමින් සිටියි. සිනමා ලොවේ මෑත ජනප්‍රිය වූ චිත්‍රපට ගණනාවක් මෙම විෂය තේමා කරගෙන තැනුනි. "ක්ලෝස් එන් කවුන්ටර් ඔෆ් ද තර්ඩ් කයින්ඩ්, ඊ.ටී, ස්ටාර් ට්‍රෙක්, ස්ටාර් වෝර්ස්, ඉන්ඩිපෙන්ඩන්ස් ඩේ, ඇල්ෆ්, ද ඩේ දි අර්ත් ස්ටුඩ් ස්ටිල් සහ අවතාර්" වැනි චිත්‍රපට පිටසක්වල ජීවීන් පිළිබද මතය ස්ථිර කිරීමට උත්සහ දරයි.

පිටසක්වල ජීවීන් දර්ශණ වීම පිළිබඳව බයිබලයානුකූල හා නිවැරදි විග්‍රහය මෙසේයි.

1. පිටසක්වල ජීවීන් දර්ශණය වීමේ පුවත් වලින් සියයට අනුවකට වඩා මිනිසුන්ගේ මනස්ගාත හෙවත් යම් අය තම සිතින් මවාගෙන පවසන දර්ශණය.

2. වෙනත් සාධාරණ හේතුවක් මත ඇතිවන සිද්ධියක් පිටසක්වල ජීවීන් දර්ශනය වීමක් හැටියට වැරදී වැටහීමකින් විග්‍රහ කිරීමක්.

3. අවසාන කාලයෙහි කූට ලෙස මිනිසුන් මුලා කරවන යක්ෂයාගේ අන්ත ක්‍රියකිරීමක් කරණකොටගෙන සිදුවන යක්ෂ ආත්ම ප්‍රදර්ශනයක්.

ඉහත සඳහන් තුන්වන කරුණ අපගේ අවධානයට යොමු කල යුතු වේ. මෙම පරිච්ඡේදයේ කලින් සඳහන් කර ඇති පරිදිම අවසාන මහා බොරුව මගින් මුළු මහත් ලෝකය මුලා කිරීමට යක්ෂයා සැරසෙයි. ස්වාමී වූ යේසුස්වහන්සේ වලාකුළු මතට පැමිණ තම දරුවන් ස්වර්ගයට ඔසවා ගැනීමත් සමගම එම මිනිසුන් පිටසක්වල ජීවීන් විසින් ගෙන ගියේ යැයි ප්‍රකාශ කරණු ඇත. එසේ අතුරුදහන් වූයේ ක්‍රිස්තියානි මිනිසුන් බව යෝජනා කෙරුණත් ඒ වන විට තවම පොළවේ ඉතුරුව සිටින නාමික කිතුණු ජනතාව නිසා එම යෝජනා හා අදහස ප්‍රතික්ෂේප වනු ඇත. ඇතැම් කිතුණු නිකායික නායකයින් හා පූජකවරු පවා රූපවාහිනී, ගුවන් විදුලි සහ අන්තර්ජාල ඔස්සේ එම අදහස ප්‍රතික්ෂේප කරන නිවේදන නිකුත් කරනු ඇත.

ඉහත හේතුව නිසා පිටසක්වල ජීවීන් පිළිබඳ වර්ධනය වන විශ්වාසය අවසාන කාලය පිළිබඳ නිශ්චිත ලකුණක් බව සැලකිය යුතුය. පෙර කවරදාවත් නොවූ විරූ අකාරයට පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාස කිරීමට මනුෂ්‍යයා දැන් පෙළඹී සිටින්නේ මේ නිසාමයි. යක්ෂයාගේ මෙම මුලාවෙන් ගැලවීමට ඇත්තේ එක මගක් පමණි. යේසුස්වහන්සේ වළාකුළු මතට පැමිණ ඇදහිලිවන්තයන් ඔසවා ගැනීමේ ඒ අපූර්ව සිද්ධියට ඔබත් සූදානම්ව සිටින්න. ස්වාමී වූ යේසුස්වහන්සේව ඔබගේ එකම ගැලවුම්කරුවාණන්වහන්සේ හැටියට විශ්වාස කරන්න.

# 5
# අවසාන කාලය පිළිබඳ සාක්ෂි ගොන්න

අවසාන කාලය හෝ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේ කාලය පිළිබඳව සාකච්ඡා කරන විට දැන් බොහෝ දෙනාගේ අවධානය යොමු වන සාක්ෂි ගොන්නක් තිබේ. ඒ අතර භූමිකම්පා, සාගත, වසංගත, සුනාමි, ගෝලීයකරණය, පරිසර දූෂණය, ගෝලීය උෂ්ණත්වය වැඩිවීම, මුහුදේ ජල මට්ටම ඉහළ යෑම, ඕසෝන් ස්ථරය පලුදු වීම, අන්තර්ජාලය, ක්‍රෙඩිට් කාඩ් භාවිතය, යුද්ධ හා යුද්ධ ප්‍රවෘත්ති වැනි සාක්ෂි සැලකිය හැකිය. මෙම ලැයිස්තුවේ ඇතැම් කරුණු ගැන ශුද්ධ බයිබලයේ කෙලින්ම සඳහන් වී ඇති අතර ඇතැම් කරුණු පිළිබඳව වක්‍රා කාරව සඳහන් වේ. මෙහිදී මේ ලකුණු එකින් එක විග්‍රහ කිරීමට අදහස් නොකෙරෙන අතර කරුණු දෙක තුනක් පිළිබඳව කෙටි විස්තරයක් හෝ කිරීම උචිත වේ.

### යුධ මානසිකත්වය

"ඔබවහන්සේගේ ඊමටත් ලෝකාන්තිමයටත් (යුගයේ අවසානයටත්) ලකුණු කිමෙක්දැයි" ගෝලයන් යේසුස්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්න වලට උන්වහන්සේ දීර්ඝ පිළිතුරක් දුන් බව මතෙව් 24 කියවූ කල අපට වැටහේ.

මතෙව් 24:7 හි උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කල සේක. **"ජාතියක් ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද විරුද්ධව නැගිටිනවා ඇත. නොයෙක් තැන්වල සාගත ද පොළෝකම්පාද සිදුවෙනවා ඇත".**

අප පසුකර ආ 20 වන ශත වර්ෂය තරම් යුධ වාතාවරණයක් පැවති තවත් යුගයක් මිහිපිට නොවීය. 20 වන ශත වර්ෂයේ මුල් භාගයේදී ලෝක මහා යුද්ධ දෙකකට මුහුණ දීමට ලෝකයාට සිදු විය. ඉන් සිදු වූ මරණ සංඛ්‍යාව ගණන් කළ හැක්කේ මිලියන ගණනින් පමණි. දෙවන ලෝක යුද්ධය අවසන් වී දැනට වසර 60 ක් පමණ ගත වී ඇතත් ජාතීන් එකිනෙකාට එරෙහිව කරන යුද්ධ තවම කෙලවර වී නැත. ගල්ෆ් කලාපයේ රටවල් අතර විනාශකාරී යුද්ධ ගණනාවක් පසුගිය වසර 50 තුළ සිදුවිණි. පොදුවේ ගත් කළ යුධ මානසිකත්වයක් ලොව පුරා නිර්මාණය වී ඇත. "යුද්ධ සහ යුද්ධ ප්‍රවෘත්ති ගැන නුඹලා අසනවා ඇත" යැයි යේසුස්වහන්සේ මතෙව් 24:6 හි පැවසූ අනාගත වාක්‍යය වර්තමානයට මනාව සැසඳේ. සියළු රටවල ප්‍රධාන අරමුණ වී ඇත්තේ තම යුධබලය ශක්තිමත් කර ගැනීමයි.

"ජාතියක් ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද විරුද්ධව නැගිටීම" වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සිදුවනු ඇත්තේ මහා පීඩා කාලය අග භාගයේදීය. එහෙත් අද අප දකින දේ මගින් මෙම යුගයේ අවසානයට අප ළඟා වී සිටින බවට ප්‍රමාණවත් සාක්ෂි ලැබේ. මුළු ලෝක ජනගුහණය කිහිප විටක් විනාශ කර දැමීමට තරම් ප්‍රමාණවත් න්‍යෂ්ටික අවි, රසායනික අවි, ජීව විද්‍යාත්මක අවි සහ අනෙකුත් අවි ලෝකය සතුය. මීට වසර 50 ට පෙර තුවක්කුවක් දැකීම පවා බිහිසු ණු විශ්මය ජනක අත්දැකීමක් සේ සැලකූ ශ්‍රී ලංකාව වැනි රටක් අද එකම අවි ගබඩාවක් බවට පත්ව තිබේ. බිම් බෝම්බ, පුද්ගල නාශක බෝම්බ,තුවක්කු, පතොරොම් ප්‍රමාණය පිළිබඳව තක්සේරුවක් කල නොහැකි තරම්ය. මෙය අප රටට පමණක් ආවේනික වූ තත්වයක් නොව ලෝකය පුරා ඇති ප්‍රවණතාවයකි. අවසාන ලෝක මහා යුද්ධයක් අත ළඟ තිබේ. එය න්‍යෂ්ටික හා රසායනික ආයුධ භාවිතා වන යු ද්ධයක්ම බවට බයිබලය අනතුරු අඟවයි. "යෙරුසලමට විරුද්ධව යුද්ධයට ආවා වූ සියලුම ජනයන්ට ස්වාමින්වහන්සේ පමුණු වන්නාවූ පීඩාව මේය. ඔවුන් සිටගෙන සිටිද්දීම ඔවුන්ගේ මාංශය ක්ෂය වන්නේය. ඔවුන්ගේ ඇස් ඒවායේ සිදුරු වලම ක්ෂය වන්නේය. ඔවුන්ගේ දිවද

ඔවුන්ගේ කටේම දිය වන්නේය" (සෙකරියා 14:12).

කරුණු මෙසේ හෙයින්, ලෙවේ සාමය ඇති කිරීම අරමුණු කරගත් එක්සත් ජාතීන්ගේ සංගමය ඇතුළු වෙනත් බොහෝ සාම සංවිධාන තිබියදීත් ලොව පුරා යුධ මානසිකත්වය වර්ධනය වීමෙන් අපට පෙනී යන්නේ යේසුස් වහන්සේගේ දෙවැනි පැමිණීමේ කාලයට අප ආසන්නව සිටින බවය.

## භූමිකම්පා

"නොයෙක් තැන්වල සාගතද පොළොව කම්පාද සිදුවෙනවා ඇතැයි" යේසුස්වහන්සේ අවසන් කාලය පිළිබඳ ප්‍රකාශ කල සේක. සුලබව පොළෝකම්පා සිදුවන මෙවන් වකවානුවක් මනුෂ්‍ය ඉතිහාසයේ තිබුණේම නැත. රික්ට මාපකයේ අගය 5 ට වැඩි විනාශකාරී භූමිකම්පා බෙහෝමයක් පසුගිය වසර කිහිපය තුලදී සිදුවිය. මෙවැනි භූමිකම්පා ප්‍රමාණය වැඩිවීමක් මනුෂ්‍යයා මීට පෙර අත්දැක නැත. එය පහත දත්ත වගුවෙන් මනාව පැහැදිලි වේ.

## 20 වන ශත වර්ෂය

| දශකය | භූමිකම්පා ගණන |
|---|---|
| 1 වන දශකය - (1900-1910) | - 03 |
| 2 වන දශකය - (1911-1920) | - 02 |
| 3 වන දශකය - (1921-1930) | - 02 |
| 4 වන දශකය - (1931-1940) | - 05 |
| 5 වන දශකය - (1941-1950) | - 04 |
| 6 වන දශකය - (1951-1960) | - 09 |
| 7 වන දශකය - (1961-1970) | - 13 |
| 8 වන දශකය - (1971-1980) | - 51 |
| 9 වන දශකය - (1981-1990) | - 86 |
| 10 වන දශකය -(1991-2000) | - 150 |

වසර 2000 සිට මේ දක්වා වසර දහයක කාලය තුළ සිදු වී ඇති භූමිකම්පා ප්‍රමාණය 20 වන ශතවර්ෂය පුරාම සිදු වූ මුළු භූ චලන ප්‍රමාණය මෙන් විශාල ගුණයකි. පසුගිය වසරේ පමණක් සිදු වූ භූ චලන හා පසු චලන ප්‍රමාණය අති විශාලය. මෙය පෙර නොවූ විරූ තත්වයකි. මුළු පොළෝ ගර්භයම අස්ථාවර භාවයට පත් වෙමින් පවතී. අනාගතයට සිදුවෙන්න තිබෙන බරපතල භූ චලන 4 ක් පිළිබඳව එළිදරව් පොතේ සඳහන් ව තිබේ. එළිදරව් 6:12, 8:5, 11:13, හා 16:17 සිට 20 දක්වා. මෙයින් අවසාන එක වන එළිදරව් 16 හි සඳහන් භූ චලනය අති මහත් එකක් වන අතර භයානක සුනාමි තත්වයක් වර්ධනය කරන භූ චලනයක් බව එම දේව වචන කොටස් කියැවීමෙන් අපට පැහැදිලි වේ.

## ගෝලීයකරණය

විශ්ව ගම්මාන සංකල්පය වර්තමාන ලෝකය වෙලාගෙන ඇත. අධිවේගී තාක්ෂණ දියුණුව හේතුවෙන් මුළු ලෝකයම එකම ගමක් බවට පත් වී ඇත. සන්නිවේදනය, මුදල් හුවමාරුව, තොරතුරු ලබා ගැනීම එක මොහොතකින් කළ හැකි දේ බවට පත්ව තිබේ. ලොව එක තැනක සිදුවන දෑ එම මොහොතේම ලෝකය පුරා දැකීමටත් ඊට එක නිමේෂයකින් ප්‍රතිචාර දැක්වීමටත් හැකිවන තරමට අපි තාක්ෂණ දියුණුවක් ලබා සිටිමු. ලෝකයේ ඕනෑම තැනක, නගරයක, වීදියක ගමන් කරන මනුෂ්‍යයකු දැක හඳුනා ගැනීමට හැකි තරම් දියුණු සැටලයිට්(චන්ද්‍රිකා) තාක්ෂණයක් අද ලෝකය සතුය. මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය කුමක්ද? එය නම් විරුද්ධ ක්‍රිස්තුස් නැමති විනාශයේ පුත්‍රයා ප්‍රකාශ වීමට පසුබිම සකස් වීමයි.

ඉහත සඳහන් දෑට අමතරව ලෝකයේ විවිධ රටවල ඇතිවන සාගත, වසංගත, පරිසර දූෂණ, හිංසාවාදීකම, සහ ත්‍රස්තවාදය අවසන් කාලය පිළිබඳව දේව වචනයෙහි සඳහන් ලකුණු හා සැසඳේ. ගෝලීය උෂ්ණත්වය වැඩිවීම, මුහුදු ජල මට්ටම ඉහළ යෑම, පෘතුවියට ඉහලින් ඇති ඕසෝන ස්ථරය පලුදු වීම, අන්ත දේශගුණික තත්වයන් වැනි ස්වභාවික විපර්යාසයන්ද අන්තර් ජාලය ක්‍රෙඩිට් කාඩ් භාවිතය, ජන

ඉංජිනේරු තාක්ෂණය සහ න්‍යෂ්ටික බලශක්ති භාවිතය වැනි මිනිස් උත්සාහයන්ද අවසන් කාලයේ ලකුණු බවට දේව වචනයේ අපට ඉඟි කරයි.

දනියෙල් 12:4 හි සඳහන් පරිදි අන්තිම කාලයෙහි "දැනගැන්ම වැඩි වන්නේය". ඇත්තෙන්ම 20 වන ශතවර්ෂයේ මුල පටන් මේ දක්වා සිදු වූයේ දැනගැන්ම සහ නව සොයා ගැනීම් සීඝ්‍රයෙන් වැඩි වීම යයි කිවහොත් එය අවතක්සේරුවකි. ඇත්තෙන්ම දැන ගැන්ම විශාල ලෙස වැඩි වී පිපිරුණා සේය (KNOWLEDGE EXPLOSION).
1904 රයිට් සහෝදරයන් පළමු සැහැල්ලු ගුවන් යානය පියාසර කරවීමේ සිට මිනිසා හඳ මත පා තැබීම දක්වා ගත වූයේ වසර 65 ක් පමණි. සෑම විද්‍යා කෙෂ්ත්‍රයකම මෙවන් පුදුම තාක්ෂණික දියුණුවක් පසුගිය ශතවර්ෂය තුළ සිදු විණි. ශත වර්ෂ 19ක් තිස්සේ සිදු වූ දැනුම වර්ධනයට වඩා 20 වැනි ශත වර්ෂය තුළ මිනිසාගේ විද්‍යාත්මක දැනුමත් තාක්ෂණික හැකියාවත් අධික වේගයෙන් වැඩි දියුණු විය. **"අන්තිම කාලයේදී දැනගැන්ම වැඩි වන්නේ යැයි"** දෙවියන්වහන්සේ දනියෙල් තුළින් ප්‍රකාශ කල අනාගත වාක්‍යය දැන් ඉටු වී තිබේ.

තවත් උදාහරණයක් යෝබ් 38:22 හා 23 හි දැක ගත හැකිය. **"කැලඹීමේ කාලයට ද යුධ හා සටනේ දවසටද මා විසින් ඉතුරු කර තබා තිබෙන හිම ගබඩා ළගට නුඹ පැමිණියෙහිද?"** උත්තර හා දක්ෂිණ ධ්‍රැවයන්හි එක්රැස් වී තිබෙන හිම සහ අයිස් කන්දරාව ක්‍රමානුකූලව දිය වීමට පටන් ගෙන තිබෙන බව දැන් නොරහසකි. මේ තත්වය කැළඹීමේ කාලය උදෙසා දෙවියන්වහන්සේ විසින් කලින් සූදනම් කර තිබුණු බව ඉහත බයිබල් පදයේ සඳහන් වේ. ඒ මගින් මුහුදේ ජල මට්ටම ඉහල යෑමත් සමගම කුඩා දූපත් බොහෝමයක් ජලයෙන් යට වීමේ තර්ජනයට මුහුණ පා සිටිති.

## ත්‍රස්තවාදය

වර්තමාන ලෝකයේ සමාජීය පිළිකාවක් ලෙස සැලකෙන ත්‍රස්තවාදය බයිබලය හඳුන්වන්නේ **නොපනත්කම** හැටියටය. එනම් පණතකට අනුකූල නොවන හැසිරීම් රටාවය. තමා අරමුණු කරන දේ අනුන් ත්‍රස්ත්‍ර කිරීමෙන් ලබා ගැනීමට ලොව පුරා විවිධ කණ්ඩායම් ප්‍රයත්න දරති. ඒ මගින්

ඇති වී තිබෙන ජීවිත හා දේපල විනාශයන් මෙතෙකැයි කියා ගණන් කල නොහැකි තරම්ය. **“මක්නිසාද නොපනත්කමේ අභිරහස දැනටම ක්‍රියා කරන්නේය........ එවිට නොපනත්කම් කරන්නා එළිදරව් වන්නේ”** යැයි 2 තෙසලෝනික 2:7 සහ 8 හි සඳහන් සිද්ධියට අදාල කාලය දැන් පැමිණ ඇත. සෑම තැනකම නොපණත්කම ක්‍රියාකරන බව අපට පෙනේ. නෝවාගේ දවස් වල ජල ගැල්මෙන් ලෝකය විනාශ කිරීමට පෙර ලෝකය තිබූ තත්වයට අපි යලි පැමිණ සිටිමු. **“මනුෂ්‍යයාගේ**

දුෂ්ටකම පොළොවේ මහත් බවද ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණත් නිරන්තරයෙන් නපුරුව තිබෙන බවද ස්වාමීන්වහන්සේ දුටු සේක" (උත්පත්ති 6:5). "දෙවියන්වහන්සේ පොළව දෙස බැලු සේක. බලව, එය දුෂ්ඨව තිබුනේය ..........මාංශමය වූ සියල්ලන් කරණකොටගෙන පොළොව බලත්කාරයෙන් පිරී තිබෙන බැවින් ඔවුන්ගේ අන්තිමය මා ඉදිරියට පැමිණ තිබේ" (උත්පත්ති 6:12-13). නිසැකයෙන්ම අප දැන් සිටින්නේ එවැනිම කාලසීමාවකය. එසේ නම් දෙවියන්වහන්සේගේ විනිශ්චය දැන් ළඟ ළඟම තිබේ.

# 6
# ඉවත්කර ගැනීමේ මෙහෙයුම

**"මෙන්න නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින් ඇසිපිය හෙලන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව (1කොරින්ති 15:51,52).**

**"එවිට ජීවත්ව ඉතිරිව සිටින අපි එක විටම ඔවුන් සමග ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුළුවලින් අහසට ඇදගනු ලබන්නෙමුව (1 තෙසලෝනික 4:17).**

අප දැන් ජීවත්වන කාල වකවානුව කොපමණ තීරණාත්මක දැයි මෙම පොතෙහි මෙතෙක් ඔබ කියවූ දෑ තුළින් ඔබට ඒත්තු යනවාට සැක නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්නාටත් නොඅදහන්නාටත් ඉන් බලවත් අනතුරු ඇඟවීමක් කෙරේ. එහෙත් එවන් අනතුරු ඇඟවීමකට වඩා බෙහෙවින් ශ්‍රේෂ්ඨ වූ යමක් බයිබලය අපට පවසයි. එය නම් කිතුණු ඇදහිලිවන්තයා ඉදිරිපිට තිබෙන තේජවත් සහ ආශිර්වාදලත් බලාපොරොත්තුවයි. මතුවට සිදුවෙන්නට තිබෙන සියලු දෙයින් අති ශ්‍රේෂ්ඨතම සිදුවීම මේ යැයි සහතික ලෙස පැවසිය හැකිය. එය දෙවියන්වහන්සේ තම දරුවන් පොළෝතලයෙන් ඉවත් කරගැනීමේ

මහා මෙහෙයුමයි. මෑතකදී ජපානයේ සිදුවූ භූමිකම්පාවෙන් අනතුරුව න්‍යෂ්ටික බලාගාර වලින් වීකිරණශීලී කිරණ කාන්දු විමේ අවදානම ඇති වූ විට ජපාන රජය කලේ එම බලාගාර අවට කිලෝ මීටර 20 ක් දුරට ජීවත් වූ සියළු මිනිසුන් ඉවත් කර ගැනීමේ මෙහෙයුමක් දියත් කර ගැනීමයි. මෙවැනිම ඉවත් කර ගැනීමේ මෙහෙයුමක් දෙවියන්වහන්සේ විසින්ද සැළසුම් කර තිබේ. ඔබ සෑම කෙනෙකුම මෙම පොත කියවීම තුලින් දැනගන්න කරුණු අතරෙන් වැදගත්ම කරුණ මෙයයි. මෙයට සභාව ඔසවා ගැනීම යැයි නම් දී තිබේ.

**"මාගේ ඉවසීමේ වචනය නුඹ රක්ෂා කල හෙයින් පොළොවේ වසන්නන් පරීක්ෂා කිරීමට මුළු ලෝකය පිටට පැමිණෙන්නට තිබෙන්නාවූ පරීක්ෂාවේ පැයෙන් මමත් නුඹ ආරක්ෂා කරන්නෙමි" (එළිදරව් 3:10).** සභාවට දෙනු ලැබූ මෙම අගනා පොරොන්දුව ඉටු වීමට දැන් කාලය එළඹ ඇත. "**මුළු ලෝකයා පිටට පැමිණෙන්න තිබෙන පරීක්ෂාවේ පැය**" දැන් අත ළඟය. ඇත්තෙන්ම එහි ආරම්භක ලකුණු දැනටමත් අපි දකිමු. එහෙත් මහා පීඩාව සහ වින්නැහිය ආරම්භ වීමට ප්‍රථම යේසුස්වහන්සේ තම සභාවට වූ පොරොන්දුව ඉටු කරමින් ඇදහිලිවන්ත සමූහයා මෙලොවින් ඉවත් කරගනු ඇත. මෙය අපට හිතාගන්ටවත් බැරි තරම් අපූරු අත්දැකීමක් වනු ඇත. එනම් හදිස්සියේම "අන්තිම හොරණෑව" පිඹිනු ලබනු ඇත. එවිට ඇසි පිය හෙළන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබනු ඇත. එනම් අපගේ මේ ශරීර තේජවත් සිරුර බවට වෙනස් වනු ඇත. ඊළඟට සිදුවන්නේ අපූර්ව දෙයකි. "**එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එක විටම......ස්වාමීන්වහන්සේ සම්මුඛ වන පිණිස වලාකුළු වලින් අහසට ඇදගනු ලබන්නෙමුව**". මෙසේ අප හිටිහැටියේම ගුවන් ගත වීමක් සිදුවීමට නියමව තිබේ. ස්වාමීන්වහන්සේ අප ගෙනයෑමට පැමිණෙන බවට දේව වචනයෙහි නැවත නැවතත් පොරොන්දු වී තිබේ. අප බලාපොරොත්තු නොවන මොහොතකදී තමන් පැමිණෙන බව යේසුස්වහන්සේ පැවසූ සේක. "එබැවින් සෑදී සිටපල්ලා මක්නිසාද නුඹලා නොසිතන පැයකදී මනුෂ්‍ය පුත්‍රයා එනසේක" (මතෙව් 24:44).

**"මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරම් නම්.....මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි" (යොහන් 14:3).**

ඉහත කී ගුවන් ගත වීමට ඔබ සූදානම්ද? එය ඕනෑම මොහොතක සිදුවිය හැකිය. එම සිදුවීමෙන් අනතුරුව මිහිපිට දිගහැරෙන සිදුවීම් මාලාව සඳහා කාලය එළඹ ඇති බව ඉහත පරිච්ඡේද වලින් අපි දුටුවෙමු. අවසන් සිදුවීම් මාලාවේ ආරම්භය ඇදහිලිවන්ත සමූහයා ස්වර්ගයට ඔසවා ගැනීමයි. පිටසක්වල ආක්‍රමණයකින් මිනිසුන් ඩැහැ ගන්නා ලදැයි සාවද්‍ය පැහැදිලි කිරීමක් මෙම සිදුවීමට ආරූඪ කරනු ඇත. එහෙත් සත්‍යය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහන ඔබත් මමත් ස්වර්ගාරෝහණය වීමය.

## මෙම පොත කියවන ඔබගේ කාර්ය භාරය

අනාගතයට සිදුවන්නට තිබෙන වැදගත්ම සිදුවීම පිළිබඳව දැන් ඔබ දැනුවත්ව සිටී. එම දැනුම මගින් ඔබ පිට පැවරෙන්නේ අති මහත් වගකීමකි. ලෝකය අභාග්‍ය සම්පන්න ලෙස විනාශය කරා ගමන් කරමින් සිටියි. එහෙත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ස්වර්ගීක හා සදාකාලික පවුලට ඇතුලත් වීම සඳහා ඔබට ආරාධනා කරන සේක. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මීට වසර 2000 ට පෙර මෙලොවට පැමිණීමත්, අප එකිනෙකාගේ පාප සහ වරද උදෙසා ජීවිත පූජාව මගින් දඬුවම ගෙවා දැමීමත් නිසා දෙවියන්වහන්සේගේ පවුලට ඇතුල් වීම දැන් අපට පහසු කර දී තිබේ.

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පළමු වතාවේ මේ ලෝකයට පැමිණි කල උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ ඔබගෙත් මගෙත් ස්ථානය ගත්තා වූ ආදේශකයාණෝ වීමයි. ඔබගේ දිවිය පුරා ඔබ කරන සෑම පාපයකටම වරද සහ දඬුවම උන්වහන්සේ තමන් පිට ගත් සේක. එසේ ගෙන උන්වහන්සේ කුරුසිය මත මරණයට පත් වූ සේක. එම මරණය මගින් ඔබගේ පාප උදෙසා එතුමන් වන්දි ගෙවූ අතර ඔබට ප්‍රදානය කිරීම සඳහා පව් කමාව දෙවියන්වහන්සේ වෙතින් ලබාගෙන තිබේ.

## එය දීමනාවකි

**"පාපයේ කුලිය නම් මරණයයි. නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව**

**නම් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයයි" (රෝම 6:23)**

පාප කමාව ඔබ ලබා ගත හැක්කේ දෙවියන්වහන්සේ ඔබට දෙන දීමනාවක් නොහොත් තෑග්ගක් හැටියට පමණකි. ඔබටම එය උපයා ගත නොහැකිය. ඔබ එය ලබා ගැනීමට සුදුස්සෙකු ද නොවේ. එහෙත් දෙවියන්වහන්සේ තම කරුණාවෙන් ඔබ වෙත පාප කමාව ප්‍රදානය කරන සේක. ඒ සමගම දෙවියන්වහන්සේ සමග නිරන්තර සම්බන්ධතාවයක් ඔබට හිමි වේ. ඔබට මෙම තෑග්ග ලැබීමට අවශ්‍ය නම් පහත සඳහන් වචන කිහිපය සිතේ අවංක කමින් කියන්න. මෙම වචන යොමු කරන්නේ දෙවියන්වහන්සේ වෙතටයි. මෙය දෙවියන්වහන්සේට කරන කෙටි යාච්ඥාවකි.

**"දයාබර දෙවියන්වහන්ස, මම පව්කරුවෙකු බව පිළිගනිමි. මාගේ පාප වල දඬුවම ගෙවීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියක් මත තමන් ජීවිතය පූජා කිරීම ගැන ඔබවහන්සේට ස්තුති කරමි. ඔබ වහන්සේ පිරිනමන පව්කමාව මම මේ මොහොතේදීම පිළිගනිමි. දයාබර යේසුස්වහන්ස, මේ මොහොතේදීම මගේ සිත තුළට ඇතුල් වුව මැනව. ඔබවහන්සේ මේ දැන් මට පව්කමාවත් සදාකාල ජීවනයත් ලබා දුන් බැවින් ඔබවහන්සේට ස්තුති වේවා. ආමෙන්".**

අවසාන වශයෙන් යේසුස්වහන්සේ පැවසූ මෙම වදන් විශ්වාස කරන්න **"මා වෙතට එන තැනැත්තේ මම කිසිසේත් අහක නොදමන්නෙමි". (යොහන් 6:37).** යේසුස්වහන්සේ දැන් ඔබව පිළිගෙන තිබෙනවා පමණක් නොව ඔබගේ සිත තුල ජීවත් වීමටත් පැමිණ සිටියි. එහි සැබෑ අරුත නම් ඔබ අලුත් පුද්ගලයකු බවට පත්ව සිටීමයි. දෙවියන්වහන්සේ අලුත් ජීවිතයක් දැන් ඔබට දී තිබේ.

## දෙවියන්වහන්සේ තුළ නව ජීවිතය

ඉහත ඡේදයෙහි සඳහන් වූ යාච්ඥාව අවංක සිතින් කල විට ඔබගේ සිත තුළට යේසුස්වහන්සේ ඇතුල් වූයේ ශුද්ධාත්මයාණන් එනම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙනයි. මින් ඉදිරියට

ඔබගේ ජීවිතයේ දිව්‍ය මාර්ග උපදේශකයා වන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේය. ශුද්ධ වූ බයිබලය ඔබට අවශ්‍ය දැනමුතුකම් හා අවශ්‍ය උපදෙස් ලබා දෙන පොතකි. දැන් ඔබට තිබෙන්නේ ෙ දවියන්වහන්සේ අදහන්නාවූ කෙනෙකු ලෙස ජීවිතය ඉදිරියට ගෙන යෑමයි.

## අලුත් කිතුණු ඇදහිලිවන්තයකු ලෙස ඔබ කලයුතු දේ සැකවින් මෙසේය.

______ශුද්ධ වූ බයිබලය ලබාගෙන එය ක්‍රමාණුකූලව දිනපතා කියවන්න. පළමුව අලුත් ගිවිසුම් කොටස නිම කොට ඉන්පසු පරණ ගිවිසුම් කොටස කියවන්න.

දිනපතා මද වේලවක් හෝ තනිව සිට දණ නමා යාච්ඤාවෙන් දෙවියන්වහන්සේට කථා කරන්න.

ඔබ මෙන්ම යේසුස්වහන්සේ අදහාගත් වෙනත් ඇදහිලිවන්තයන් සමඟ සම්බන්ධ වී සහභාගීකම් පවත්වන්න. අත්දැකීම් බෙදාගන්න. එසේ කල හැකි ක්‍රිස්තියානි සභාවක පංගුකාරයෙකු වන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඔබ ඇරඹූ අළුත් ජීවිතය පිළිබඳ අත්දැකීම් අනෙකුත් අය සමඟ පවසන්න.

යේසුස්වහන්සේ අදහාගැනීම ගැන ඔබ ගත් තීරණ පිළිබඳව අප

වෙත දන්වා එවන්න. ඒ සඳහා මීළඟ පිටුවේ ඇති කූපනය භාවිතා කරන්න.

කූපනය එවිය යුතු ලිපිනය:

**විස්ඩම් පබ්ලිෂර්ස්**
**7, විවේකානන්ද පාර,වැල්ලවත්ත,**
**කොළඹ -6.**

**<u>නව ජීවිතය පිළිබඳව මගේ තීරණය</u>**

**නම :** ..................................................................................................................

**ලිපිනය :** ..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

**වයස : ..............................................**

**දුරකථන අංකය :** ................................

**පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් තෝරා ඉදිරිපස ඇති කොටුව තුළ කතිරයක් ලකුණු කරන්න.**

- මෙම පොත කියවීමෙන් පසු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අවංකව අදහාගැනීමට තීරණය කෙළෙමි.

- මෙම පොත කියවීමෙන් යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම පිළිබඳව කරුණු දැනගත්තෙමි.

**දිනය:**.................................